කාර්යසාධන වාර්තාව

2025



සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

ජය මාවත, කටුබැද්ද, මොරටුව.
දුරකථන අංකය : **011-2650962**
ෆැක්ස් අංකය : **011-2044879**
වෙබ් අඩවිය : **http://www.csd.lk**

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2025 වර්ෂය සඳහා වන ප්‍රගතිය පිළිබඳව කාර්ය සාධන වාර්තාවට මෙම පණිවුඩය නිකුත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙමි.

මෙම දෙපාර්තමේන්තුව වර්තමානයේ බලකා මූලස්ථාන, පුහුණු පාසල් සහ විශේෂ ව්‍යාපෘති වශයෙන් දිපව්‍යාප්තව ස්ථාන 32ක, හට පිරිස් 31219 කින් සමන්විත ශ්‍රී ලංකාවේ එකම පරිපූරක හමුදාව වශයෙන් තිස්වසරක කුරිරු යුද්ධයේ පශ්චාත් අවධිය තුළ දී රට නැවත ගොඩනැගීමේ මහඟු ක්‍රියාවලියට තම දායකත්වය ලබාදෙමින් සිටියි. ශ්‍රී ලංකාව පුරා ඉතාමත් ශක්තිමත්ව විහිදුනු මෙම දෙපාර්තමේන්තුව තම ප්‍රධාන රාජකාරීන්ට අමතරව කෘෂි කාර්මික,කෘෂි කාර්මික නොවන ව්‍යාපෘතීන් සඳහා ප්‍රධාන ලෙස සක්‍රීයව දායකත්වය සපයනු ලබයි. තවද අලි මිනිස් ගැටුම අවම කිරීම උදෙසා වනජීවී දෙපාර්තමේන්තුව හා සම්බන්ධතාවයෙන් කටයුතු කරනු ලබන අතර, එහිදී දිවයින පුරා ස්ථාපිත විදුලි වැටවල් 397ක (කි.මී 4699.82) නඩත්තු සහ අධීක්ෂණ කටයුතු සඳහාත්, වන අලි පලවා හැරීමේ රාජකාරී සඳහාත්, වනජීවී කාර්යාල වෙත සිවිල් ආරක්ෂක සාමාජිකයින් 3925 දෙනෙකු යොදවා ඇත.
2025 වර්ෂයේ දී ලෝකවාසී බැතිමතුන්ගේ වන්දනාමාන කිරීම සඳහා වසර 16 කට පසුව පැවැත්වූ ශ්‍රී දළදා ප්‍රදර්ශනය සඳහා පාලන කටයුතු වෙනුවෙන් සිවිල් ආරක්ෂක සාමාජික/සාමාජිකාවන් විසින් උපරිම දායකත්වය ලබාදෙන ලදී. තවද දැනට දීඝවාපිය චෛත්‍ය, නීලගිරිය චෛත්‍ය ඇතුළු පුරාණ බෞද්ධ සිද්ධස්ථාන නැවත වරක් ලෝකවාසී බෞද්ධ බැතිමතුන්ට වන්දනාමාන කිරීම උදෙසා ප්‍රතිසංස්කරණය කිරීම මෙන්ම දිවයින පුරා විසිරුණු ආගමික සිද්ධස්ථාන නහා සිටුවීමේ කාර්යය සඳහාත්, විවිධ බාහිර පාර්ශවයන් වෙතින් එල්ලවන බලපෑම්වලින් බෞද්ධ මධ්‍යස්ථාන මෙන්ම පුරාවිද්‍යා වටිනාකමක් ඇති ආගමික ස්ථාන ආරක්ෂා කිරීමේ කාර්යය සඳහාත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින් තම දායකත්වය ලබාදෙමින් සිටිති. විවිධ රාජ්‍ය ආයතනවල ඉල්ලීම පරිදි එම ආයතනවල ආරක්ෂක රාජකාරීන් ද ශ්‍රී ලංකා පොලිසිය සමඟ එක්ව නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ ක්‍රියාවලියේ සක්‍රීය කොටස්කරුවන් වෙමින් ද, රටට අත්‍යාවශ්‍ය වූ සුළු හා මධ්‍ය පරිමාණ ඉදිකිරීම් ඉතාමත් කාර්යක්ෂම මෙන්ම ඉහළ ගුණාත්මක භාවයකින් යුක්තව සාපේක්ෂව අඩු පිරිවැයකින් ඉටු කිරීමේ කාර්යයට ද වර්තමානයේ මෙම දෙපාර්තමේන්තු සාමාජිකයන් දායකත්වය ලබා දී ඇත.

එමෙන්ම රටේ කෘෂි කර්මාන්තය මෙන්ම අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා මෙම දෙපාර්තමේන්තු සාමාජික/සාමාජිකාවන්ගේ සේවය ලබාදෙන අතර, පසුගිය වසර තුළ දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් ඉලක්ක හා අරමුණු සාර්ථකව ඉටුකර ගැනීමට හැකියාව ලැබී ඇත. එහිදී මෙම දෙපාර්තමේන්තුව වෙතින් රුපියල් මිලියන 2201.7 ක ආදායමක් උපයා ගැනීමට හැකිවී ඇත.

තවද මෙවන් විශාල සේවයක් රට වෙනුවෙන් සපයන්නා වූ සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ වෘත්තීය දැනුම නංවාලීම සඳහා සුවිශේෂී ක්‍රියාමාර්ග රැසක් මේ වන විට ක්‍රියාවට නංවා ඇති අතර, ඔවුන්ගේ ආකල්ප, කුසලතා මෙන්ම ඔවුන්ගේ සේවා තෘප්තිය ඉහළ නැංවීම උදෙසා විශේෂ ක්‍රියාමාර්ග රැසක් මේ වන විට ආරම්භ කර ඇත. ඒ අතර ලිපිකරු පාඨමාලා, ගබඩාකරණ පාඨමාලා, පරිගණක පාඨමාලා හා විවිධ වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වීම මඟින් ඔවුන්ගේ රාජකාරී කටයුතු මනාව ඉටුකිරීමට අවශ්‍ය දැනුම ලබාදීම මඟින් ඔවුන්ගේ දායකත්වය තවදුරටත් ඉහළ එලදායීතාවයකින් ලබා ගැනීමට කටයුතු කර ඇත. තවද ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් පවත්වන ලද ක්‍රීඩා ඉසව් සඳහා ක්‍රීඩකයින් සහ ක්‍රීඩිකාවන් යොමු කිරීම තුළින් ලබාගත් ජයග්‍රහණයන්ගෙන් රටට කීර්තියක් අත්කර දීමටද දෙපාර්තමේන්තුවක් වශයෙන් අපහට හැකියාව ලැබී ඇත.

පසුගිය වසරවල මෙන්ම 2025 වර්ෂයේත් නිවාස නොමැති සිවිල් ආරක්ෂක සාමාජිකයින් හට නිවාස ලබාදීම ද නිවාසවල වැඩ අවසන් කිරීමට නොහැකිවූවන් හට ඒවායේ වැඩ අවසන් කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදීම ද, දෙපාර්තමේන්තු සාමාජිකයන්ගේ දුවා දරුවන්ගේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය පොත්පත් ආදිය නොමිලේ ලබාදීම ද මේ වන විට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් සිදුකරමින් පවතී. එමඟින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින්ගේ සාමාජීය තත්ත්වයන් ඉහළ නැංවීම මූලික පරමාර්ථය වී ඇත.

එසේම **"දිවිවෑ"** සුළිකුණාටුව හේතුවෙන් රටතුල ඇතිවූ ආපදා තත්වය හමුවේ ත්‍රිවිධ හමුදාවන් සමඟ උරෙන් උර ගැටෙමින් ආපදා සහන සේවාවන්හි නියැලෙමින් ජනජීවිතය යථාතත්වයට පත්කිරීමට මෙම දෙපාර්තමේන්තු සාමාජික/සාමාජිකාවන් ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරන ලදී. තවද දිවයින පුරා ග්‍රාමීය මට්ටමින් ඩෙංගු උවදුර මැඩපැවැත්වීම උදෙසා ශ්‍රමදාන කාර්යයන් හා ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සමඟ සම්බන්ධතාවයෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීමත්, මතින් තොර දේශයක් බිහිකිරීමේ කාර්යය වෙනුවෙන් රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන **"රටම එකට ජාතික මෙහෙයුම"** ට සමගාමීව මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූවන් පුනුරුත්ථාපනය කිරීමේ කටයුතු වෙනුවෙන් නව පුනුරුත්ථාපන මධ්‍යස්ථාන 03ක් ආරම්භකර පවත්වාගෙන යාම, පුහුණුවලත් උපදේශකයින් මඟින් මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශන වැඩමුළු පැවැත්වීමත්, ලේ දන් දීමේ වැඩසටහන් සඳහා දායකත්ව සැපයීමත්,Clean Sri lanka වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ ජීවිතාරක්ෂක කණ්ඩායම් මඟින් දෙස් විදෙස් ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීමේ කාර්යයන් ඉටුකිරීමත් වැනි සමාජ සුබසාධන කාර්යයන් නිරත වීම හා ඒ පිළිබඳ දෙපාර්තමේන්තු සාමාජිකයින් ඇගයීමට ලක්වීම ඉතා ප්‍රශංසනීය වනු ඇත.

මාතෘ භූමියේ තිරසාර සංවර්ධනය නංවාලීම සඳහා මෙන්ම නීතිය හා සාමය පවත්වාගෙන යාම උදෙසා අවශ්‍ය සහය උපරිම ලෙස ලබා දීමටත්, මෙම වසරේදී **"පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්"** යන තේමාව යටතේ ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රවේශයට අනුගත වෙමින් අප වෙත පැවරෙන සියළුම වගකීම් කැපවීමෙන් මෙන්ම හැකි උපරිම අයුරින් ඉටු කිරීමටත් අප මාතෘභූමිය ගොඩනැංවීමේ කාර්යය උදෙසා ලබාදිය හැකි උපරිම දායකත්වය ලබා දීමට අපේක්ෂා කරන අතරම එම කාර්යයන් උසස් එලදායීතාවයකින් ලබාදීම උදෙසා නිලධාරීන් ඇතුළු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජික/සාමාජිකාවන්හටත්, සිවිල් කාර්යය මණ්ඩලයටත් අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබෙවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

මේජර් ජෙනරල් කේඑච්පීපී ප්‍රනාන්දු
ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ
අධ්‍යක්ෂ ජනරාල්

දෙපාර්තමේන්තු පරිපාලන කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිළධාරියාගේ නම	තනතුර
1	මේජර් ජෙනරල්	කේඑච්පීපී ප්‍රනාන්දු ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්පී යූඑස්පී එන්ඩීයූ	අධ්‍යක්ෂ ජනරාල්
2	මේජර් ජෙනරල්	කේආර්කේකේටී බංඩාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
3	බ්‍රිගේඩියර්	එම්ඒඑස් වැලිගම	අධ්‍යක්ෂ මෙහෙයුම්
4	බ්‍රිගේඩියර්	ඒඑම්ඒසීඒ උහරාපොල ආර්එස්පී	අධ්‍යක්ෂ පිරිස් පාලන
5	කර්නල්	යූවීඩබ්එස් අමරසිරි	අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන/ පුහුණු හා සේවා වනිතා සම්බන්ධීකරණ නිලධාරි
6	කර්නල්	එස්බීආර් රාජපක්ෂ ආර්එස්පී	අධ්‍යක්ෂ ව්‍යාපෘති
7	කර්නල්	ඩබ්එම්ජේජී වනිගසේකර	අධ්‍යක්ෂ සුබසාධක/ මාධ්‍යය
8	කර්නල්	ආර්ආර්පී ලක්සිරි යූඑස්පී	සේනාවිධායක - සේරුපිට
9	කර්නල්	පීපීඑස්ඩීජේ පතිරගේ ආර්එස්පී	අණදෙන නිලධාරි - කටුනායක
10	කර්නල්	එස්එම්ඒ සමරකෝන් ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - කැබිතිගොල්ලෑව
11	කර්නල්	එච්එම්එල් ප්‍රේමවන්ද්‍ර ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - කිලිනොච්චි
12	කර්නල්	ඒඩබ් නල්ලපෙරුම ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - කුරගල
13	කර්නල්	කේකේඑම්කේඩබ් කහටපිටිය අයිජී	අණදෙන නිලධාරි - විල්පත්තුව
14	කර්නල්	ඩබ්කේඑස්ආර් විජේසිරි ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - සේරුවිල
15	කර්නල්	එච්එම්ජේවීබී හේරත් ආර්එස්පී අයිජී	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (වැලිසර)
16	ලුතිතන් කර්නල්	කේඒ ආරියවංශ පීඑස්සී	අධ්‍යක්ෂ ජනරාල් ලේකම්
17	ලුතිතන් කර්නල්	එච්ටීපී කුමාරසිරි	නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රවාහන
18	ලුතිතන් කර්නල්	කේජීඑන්එස්බී දිසානායක කේඑස්පී	නියෝජ්‍ය අධ්‍යක්ෂ මෙහෙයුම්
19	ලුතිතන් කර්නල්	ඩබ්ඒඑල්ඒ කුමාර	නියෝජ්‍ය අධ්‍යක්ෂ ව්‍යාපෘති
20	ලුතිතන් කර්නල්	එච්ජීකේඑස් ධර්මදාස ආර්ඩබ්පී ආර්එස්පී	අණදෙන නිලධාරි - අම්පාර
21	ලුතිතන් කර්නල්	පීඑස්සී පිරිස් යූඑස්පී	අණදෙන නිලධාරි - කතරගම
22	ලුතිතන් කර්නල්	ඩබ්එම්එස් වික්‍රමසිංහ	අණදෙන නිලධාරි - කොණ්ඩච්චි
23	ලුතිතන් කර්නල්	ජීඒ විමලසිරි	අණදෙන නිලධාරි - ගෝමරන්කඩවල
24	ලුතිතන් කර්නල්	කේසී අකලංක	අණදෙන නිලධාරි - ත්‍රිකුණාමලය
25	ලුතිතන් කර්නල්	එච්වීසීජේ හපුආරච්චි ආර්ඩබ්පී යූඑස්පී	අණදෙන නිලධාරි - පහළලන්ද
26	ලුතිතන් කර්නල්	ආර්පීකේජී රණසිංහ	අණදෙන නිලධාරි - පුත්තලම
27	ලුතිතන් කර්නල්	ඩීඑම්ආර්කේබී නවරත්න ආර්එස්පී යූඑස්පී අයිජී	අණදෙන නිලධාරි - පොලොන්නරුව
28	ලුතිතන් කර්නල්	ටීඑම්එන්ආර් තැන්නේ ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - මහඔය
29	ලුතිතන් කර්නල්	කේඑම්කේජීආර් කෝණාරසිංහ	අණදෙන නිලධාරි - මුලතිව්
30	ලුතිතන් කර්නල්	ඩබ්එච්එම්සී විජයවර්ධන	අණදෙන නිලධාරි - මූලස්ථානය
31	ලුතිතන් කර්නල්	එස්සී ද සිල්වා ආර්ඩබ්පී ආර්එස්පී	අණදෙන නිලධාරි - මොණරාගල
32	ලුතිතන් කර්නල්	එච්එම්ආර්පී කුමාර	අණදෙන නිලධාරි - වව්නියාව
33	ලුතිතන් කර්නල්	කේඩබ්එස්කේටී කාරියවසම් යූඑස්පී පීඑස්සී	අණදෙන නිලධාරි - වැලිඔය
34	ලුතිතන් කර්නල්	ආර්ඒයූකේ රණවීරආරච්චි ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - විශ්වමඩු
35	ලුතිතන් කර්නල්	එම්එල්ජේකේ පිරිස්	අණදෙන නිලධාරි - වෙන්නවත්ත
36	ලුතිතන් කර්නල්	ආර්ඩීආර්කේ දසානායක ආර්එස්පී	අණදෙන නිලධාරී - හොරොව්පොතාන

37	ලුතිතන් කර්නල්	එම්කේඑල් දිසානායක යූඑස්පී	අණදෙන නිලධාරි - අනුරාධපුර
38	ලුතිතන් කර්නල්	එම්එෆ් ආබ්දීන් ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - කල්පිටිය
39	ලුතිතන් කර්නල්	ඩබ්එම්පීඑම් අපෝන්සු අයිඑස්සී	අණදෙන නිලධාරි - ගල්කිරියාගම
40	ලුතිතන් කර්නල්	ඩීඒ අහමඩ්	අණදෙන නිලධාරි - සේරුපිට
41	ලුතිතන් කර්නල්	ආර්එස්එම් විජේසිංහ	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (විශ්‍රාම වැටුප්)
42	ලුතිතන් කර්නල්	එස්ජේ අමදෝරු	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (ප්‍රවාහන)
43	ලුතිතන් කර්නල්	එම්ඒසීපී මාරසිංහ	සහකාර අධ්‍යක්ෂ පාලන
44	මේජර්	ඩබ්ආර් ප්‍රසන්න	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (මෙහෙයුම්)
45	මේජර්	එම්ඒඩී කුමාර	අණදෙන නිලධාරි - මැදිරිගිරිය
46	මේජර්	පීඑන්ඩී පනියන්දුව	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ලේකම්
47	මේජර්	එස්එන්ඒපී ඩයස්	අධ්‍යක්ෂ ජනරාල් සහකාර ලේකම්
48	මේජර්	ඩීඑම්එච්සී කුමාරතිලක	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (කෘෂි)
49	මේජර්	ජීඅයි චන්ද්‍ර	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (ඉදිකිරීම් හා නඩත්තු)
50	මේජර්	එච්එම්එන්එන් ප්‍රේමජයන්ත	මාණ්ඩලික නිලධාරි (මෙහෙයුම් හා ආරක්ෂක සේවා සම්බන්ධීකරණ)
51	මේජර්	බීඩීඑස් ජයවීර	නීති නිලධාරි

ශ්‍රී ලංකා නාවික හමුදා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිළධාරියාගේ නම	තනතුර
01	කපිතාන්	එම්පී ප්‍රනාන්දු	අධ්‍යක්ෂ ප්‍රසම්පාදන
02	කපිතාන්	ඩබ්එම්එන් වික්‍රමසිංහ ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - මහනුවර
03	කපිතාන්	එන්සීපීඑන් නානායක්කාර	ස්ථානභාර නිළධාරි - විශේෂ විමර්ෂණ ඒකකය
04	කොමාන්ඩර්	කේපීඑන්ජී කාරියවසම්	අණදෙන නිළධාරි - උහන
05	කොමාණ්ඩර්	ජීඑන් ප්‍රියදර්ශන	ව්‍යාපෘතිභාර නිලධාරි - විහාරමහදේවී උද්‍යානය
06	ලුතිනන් කොමාන්ඩර්	එම්ජේජේ ගුණවර්ධන	මූලස්ථාන දෙවන අණදෙන නිළධාරි
07	ලුතිනන් කොමාන්ඩර්	වයිඑම්එස්ඩී යාපා	දෙවන අණදෙන නිළධාරි - හොරොව්පතාන
08	ලුතිනන් කොමාන්ඩර්	එම්කේඒබී මායාසිංහ	නියෝජ්‍ය අධ්‍යක්ෂ තාක්ෂණ
09	ලුතිතන්	එස්ආර්ආර්එම් බංඩාර	මාණ්ඩලික නිලධාරි 1 (ප්‍රසම්පාදන)

ගුවන් හමුදා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිළධාරියාගේ නම	තනතුර
01	වින්ග් කමාණ්ඩර්	ඊඑම් කොතලාවල	නියෝජ්‍ය අධ්‍යක්ෂ පිරිස් පාලන

ශ්‍රී ලංකා පොලිස් කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිළධාරියාගේ නම	තනතුර
01	ප්‍රධාන පොලිස් පරීක්ෂක	එච් පේරුසිංහ	දෙවන අණදෙන නිලධාරි - සේරුපිට
02	පොලිස් පරීක්ෂක	එච්ආර්ආර්පී ගුණරත්න	දෙවන අණදෙන නිලධාරි - පොලොන්නරුව
03	පොලිස් පරීක්ෂක	ජේඑල්පී ප්‍රියදර්ශණ	දෙවන අණදෙන නිලධාරි - මහනුවර
04	උප පොලිස් පරීක්ෂක	ජේ විජේවර්ධන	දෙවන අණදෙන නිලධාරි - අනුරාධපුර
05	උප පොලිස් පරීක්ෂක	වීඑච්ඒ සමරවීර	දෙවන අණදෙන නිලධාරි - අම්පාර
06	උප පොලිස් පරීක්ෂක	වීටීජීඩීටීසී ප්‍රියදර්ශණ	දෙවන අණදෙන නිලධාරි - කටුනායක
07	උප පොලිස් පරීක්ෂක	ඩබ්ඒඑල් ජයමාන්න	දෙවන අණදෙන නිලධාරි - ගෝමරන්කඩවල
08	උප පොලිස් පරීක්ෂක	ඩබ්එම්ආර්කේ වික්‍රමසිංහ	දෙවන අණදෙන නිලධාරි - පහළලන්ද
09	උප පොලිස් පරීක්ෂක	එස්එස් තිලකරත්න	මාණ්ඩලික නිලධාරි - මූලස්ථානය
10	උප පොලිස් පරීක්ෂක	පීකේ ජයතුංග	මාණ්ඩලික නිලධාරි - වැලිසර
11	කාන්තා උප පොලිස් පරීක්ෂක	ඩබ්එම්සීකේ වීරසූරිය	දෙවන අණදෙන නිලධාරි - වැලිඔය

දීප ව්‍යාප්ත සේවා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිළධාරියාගේ නම	තනතුර
1	ශ්‍රීලංපසේ 1	එන්ඩබ්ජීඩී සුජීවනී මිය	අධ්‍යක්ෂ පාලන/ ප්‍රවාහන
2	ශ්‍රීලංගසේ 111	ටීඒකේපී ප්‍රේමතිලක මයා	අභ්‍යන්තර විගණක
3	ශ්‍රීලංගසේ 111	ඩබ්ඩීකේ ගුණසේන මිය	සහකාර අධ්‍යක්ෂ වැටුප්
4	ශ්‍රීලංගසේ 111	වීඩී ප්‍රසංගිකා මිය	සහකාර අධ්‍යක්ෂ ව්‍යාපෘති හා ගිණුම්

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

පටුන

ශ්‍රී ලංකා යුධ හමුදා කාර්ය මණ්ඩලය 3

ශ්‍රී ලංකා නාවික හමුදා කාර්ය මණ්ඩලය .....

ශ්‍රී ලංකා ගුවන් හමුදා කාර්ය මණ්ඩලය ....

ශ්‍රී ලංකා පොලිස් කාර්ය මණ්ඩලය හා දීප ව්‍යාප්ත සේවා කාර්ය මණ්ඩලය.....5

1 **ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය.....**8

1.1 **හැඳින්වීම** 8

1.2 **ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු**..... 8

1.2.2 **මෙහෙවර** 8

1.3 **ප්‍රධාන කාර්යයන්** 8

1.3.1 **සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට පවරා ඇති විවිධ විශේෂ ව්‍යාපෘති**..... 9

1.4 **සංවිධාන සටහන** 10

1.5 **දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ** 12

1.6 **දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්**..... 13

1.7 **විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු** 13

2 **ප්‍රගතිය හා ඉදිරි දැක්ම.....**

2.1 **දෙපාර්තමේන්තු ප්‍රගතිය** 14

2.1.1 එක් එක් බලකා මුලස්ථාන , පුහුණු කඳවුරු මඟින් 2024 වර්ෂය තුළ රජයේ ආදායමට බැර කරන ලද ව්‍යාපෘති හා සංස්කෘතික ආදායම් සටහන 15

2.2 පරිපූරක හමුදාවක් ලෙස ක්‍රියා කිරීම සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මානව සම්පත් කළමනාකරණය **16**

2.3 ජාතික උත්සව සහ වෙනත් වැදගත් අවස්ථා සඳහා දායකත්වය 17

2.4 යලි පිබිදෙන කුරගල පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාව හා පුදබිම ඉදිකිරීම් ව්‍යාපෘතිය..... 17

2.5 ඉදිකිරීම් කටයුතු සඳහා දායකත්වය 18

2.7 ගුරු හිඟය පවතින දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල් වෙත ස්වේච්ඡා ගුරුවරුන් අනුයුක්ත කිරීම . 18

2.8 දෙපාර්තමේන්තුව යටතේ පවතින බලකා මූලස්ථාන වෙතින් ක්‍රියාවට නංවා ඇති කෘෂි ව්‍යාපෘති

2.9 ඩෙංගු මර්ධන වැඩසටහන් පැවැත්වීම 20

2.10 මත් උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2.11 දෙපාර්තමේන්තුමය සුභසාධන ක්‍රියාකාරකම්..... 22

2.1 නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි 22

3 2025දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය 24

3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	24
	ඒසිඒ - එෆ්	21
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	26
	ඒසිඒ -පී	26
	2025 දෙසැම්බර් 31 දිනට	26
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	27
	ඒසිඒ-සී	27
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	29
3.4.1	වාර්තා කිරීමේ පදනම	
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	30
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	31
3.7	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රතිපාදන	31
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	31
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	32
4	කාර්ය සාධන දර්ශක	
4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	52
5	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	53
5.1	හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු	53
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	56
5.2.1	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ	56
5.2.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග	56
6	මානව සම්පත් පැතිකඩ	57
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	57
6.2	මානව සම්පත් සංවර්ධනය	58
6.3	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය	60
7	අනුකූලතා වාර්තාව	61

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1985 අංක 40 දරන මිනිස් බල උපයෝගීතා සහ පරිපූරක හමුදා පනතේ 52 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා පොලිස් සේවාවට ආධාර හා උපකාරීවීමේ කාර්ය සඳහා පිහිටුවන ලද ග්‍රාමාරක්ෂක හමුදාව, 2006.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (අමප/06/135/206/052) අනුව "සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව" නමින් නව දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුව යටතේ බලකා මූලස්ථාන 27ක් , පුහුණු පාසල් 02ක් සහ විශේෂ ව්‍යාපෘති 03 ක් ස්ථාපිත කර ඇති අතර 31219 කට ආසන්න ශ්‍රම බලකායක් සේවයේ යෙදී සිටී.

2015 ජුනි මස 12 දිනැතිව නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුවේ පැවති දිස්ත්‍රික් නිලධාරී, පාලක/නියාමක, උප පාලක/උප නියාමක, ග්‍රාම ආරක්ෂක/සිවිල් ආරක්ෂක තනතුරු විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට ප්‍රකාශයට පත් කර ඇත. තවද 2015 මාර්තු මස 05 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම දෙපාර්තමේන්තුව සතු සුවිශාල මිනිස් බල සංචිතය ඵලදායී ලෙස යොදා ගනිමින් ග්‍රාමීය ප්‍රදේශවල, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල සංවර්ධන කටයුතු සිදු කිරීමේ හැකියාව සහ දෙපාර්තමේන්තුව ආදායම් උත්පාදනය කරන ආයතනයක් බවට පත්කිරීමේ හැකියාව සලකා දෙපාර්තමේන්තු කාර්යභාරය තවදුරටත් පුළුල් කරනු ලැබීය.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1 දැක්ම

“ තිරසර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක් ”

1.2.2 මෙහෙවර

“ශ්‍රී ලංකා මාතෘ භූමියේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමට දිවි හිමියෙන් කැප වෙමින් ද, ජාතික සංවර්ධන හා ආර්ථික වර්ධන ඉලක්ක සාක්ෂාත් කරමින් ද, ‘පරිපූරක ශ්‍රම ආර්ථික බලකායක්’ ලෙස සෞභාග්‍යයේ දැක්මට විශිෂ්ට පෙර ගමන්කරුවකු වීම.”

1.3 ප්‍රධාන කාර්යයන්

1. ජාතික ආරක්ෂාව සඳහා අවස්ථාවට උචිත පරිදි සන්නද්ධ සේවාවලට සහ පොලිස් සේවාවට ආධාර හා උපකාරී වීම සඳහා පරිපූරක හමුදාවක් වශයෙන් කටයුතු කිරීම.
2. ත්‍රස්තවාදී තර්ජන පවතින අවස්ථාවලදී එසේ තර්ජන වලට ලක්වන ගම්බිම් හා නගර ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.
3. රට තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා සන්නද්ධ හමුදාවන්ට සහ පොලිස් සේවාවට සහාය දීම.
4. සිවිල් ආරක්ෂක සාමාජික සාමාජිකාවන් 10000 ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කිරීම.
5. ජාතික වැදගත්කමක් ඇති උත්සව හා වෙනත් වැදගත් අවස්ථාවන්හිදී ඊට අදාළ ආරක්ෂාව සැලසීමේ කටයුතුවල යෙදීම.

6. රට තුළ ඇතිවන විවිධ ආපදා අවස්ථාවන්හිදී (ගංවතුර, සුනාමි, නායයාම් වැනි) ආපදා කළමනාකරණ කාර්යන්වලට සහාය වීම.

7. පළාත් සභා සහ පළාත් පාලන ආයතන, විහාරස්ථාන හා ආගමික සිද්ධස්ථාන ආදියෙහි සුළු හා මධ්‍යම පරිමාණ ඉදිකිරීම් කටයුතු ඉටු කරවා ගැනීමේදී ශ්‍රම බලකායේ සේවය ලබාදීම.

8. රාජ්‍ය ආයතනවලට ආරක්ෂක සේවා සපයා ගැනීමේදී මෙම දෙපාර්තමේන්තුව සමග ගිවිසුම්ගතව ආරක්ෂක සේවාවන් ලබාදීම.

9. දෙපාර්තමේන්තුව සතු සංස්කෘතික කණ්ඩායම්වල සේවය රාජ්‍ය ආයතන මෙන්ම අනෙකුත් ආයතන වල උත්සව අවස්ථාවන් සඳහා ලබාදීම.

10. අලි මිනිස් ගැටුම් හේතුවෙන් අදාළ ප්‍රදේශවල සිදුවන හානි අවම කිරීම පිණිස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහායවීම සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින් 5000 ක ප්‍රමාණයක් එම දෙපාර්තමේන්තුව වෙත ලබා දීම.

11. දිවයින පුරා පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම සහ සංචාරක වශයෙන් වැදගත්කමක් ඇති ස්ථාන සඳහා අවශ්‍ය වන පරිදි ආරක්ෂාව සැලසීම.

12. ජීවිතාරක්ෂක කණ්ඩායම් මගින් දෙස් විදෙස් ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීමේ කාර්යයන්ට දායක වීම හා සමාජ සුබසාධන ක්‍රියාකාරකම්වලට සහාය වීම

13. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනුරුත්ථාපනය සඳහා සිවිල් ආරක්ෂක බලකා මූලස්ථානය වෙතින් ඉදුම් හිටුම්,ආරක්ෂාව හා ආහාරපාන ලබා දීම මගින් සහාය දැක්වීම''රටම එකට ජාතික මෙහෙයුම්'' යටතේ මත් ද්‍රව්‍ය භාවිතයට හුරු වූවන් පුනුරුත්ථාපනය කිරීම සඳහා පුනුරුත්ථාපන මධ්‍යස්ථාන 03 ක් පවත්වාගෙන යාම.

14. ජනාධිපතිතුමා, විෂයභාර අමාත්‍යතුමා හෝ රජය විසින් නියම කරනු ලබන විශේෂිත කාර්යයන්වල යෙදීම.

1.3.1 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට පවරා ඇති විවිධ විශේෂ ව්‍යාපෘති

අංක 1462 / 20 හා 2006.09.13 දිනැති ඇති විශේෂ ගැසට් පත්‍රයෙන් සහ 2015 මාර්තු 05 දිනැති අංක අ/ම/ප/15/0089/610/003 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් පවරන ලද ඉහත රාජකාරිවලට අමතරව, රජය විසින් වරින් වර පහත සඳහන් රාජකාරි ද පවරා ඇත.

- දිවයින පුරා වී, ධාන්‍ය, එළවළු, පළතුරු, පශු, සම්පත් ආදී විවිධ මහා පරිමාණ ව්‍යාපෘති මඟින් රටේ ජාතික ආහාර නිෂ්පාදනය ශක්තිමත් කිරීම.


- අඩු පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටුවා ඇති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මඟින් යහපත් ළමා පරපුරක් බිහි කිරීමට සහාය වීම.

- ගුරු හිඟය පවතින දුෂ්කර පාසල් සඳහා ස්වේච්ඡා පදනමින් ගුරුවරු ලබා දීම.


- උතුරු හා උතුරුමැද ප්‍රදේශ ආවරණය වන පරිදි විශාල ප්‍රමාණයේ ජල පෙරණ යන්ත්‍ර ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම.

1.4 සංවිධාන සටහන

සිවිල් ආරක්ෂක දෙපර්තමේන්තු සංවර්ධන ව්‍යුහය



සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු
බලකා/පුහුණු පාසල්/ව්‍යාපෘති කාර්යාල ස්ථානගත වීම



1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ බලකා මූලස්ථාන 26 ක් සහ පුහුණු පාසල් 02ක් සහ විශේෂ ව්‍යාපෘති කාර්යාල 01 ක් ක්‍රියාත්මක වන අතර බලකා මූලස්ථාන/පුහුණු පාසල් අණදෙන නිලධාරීන් සහ දෙවන අණදෙන නිලධාරීන් මඟින් එකිනෙක බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්හි පරිපාලන කටයුතු සිදු වේ.

එහිදී මෙම දෙපාර්තමේන්තුව සතු 31219 කට ආසන්න සිවිල් ආරක්ෂක සාමාජික/සාමාජිකාවන්ගෙන් සමන්විත මානව සම්පත විවිධ ක්ෂේත්‍රගත ව්‍යාපෘති වෙත යොමු කරවීම දෙපාර්තමේන්තු මූලස්ථානයේ මෙහෙයවීමෙන් බලකා මූලස්ථාන/පුහුණු පාසල් මඟින් සිදු කෙරේ .

බලකා මූලස්ථාන - 26

1. බලකා මූලස්ථානය
2. වෙන්නවත්ත බලකා මූලස්ථානය
3. කටුනායක බලකා මූලස්ථානය
4. මහනුවර බලකා මූලස්ථානය
5. පුත්තලම බලකා මූලස්ථානය
6. අනුරාධපුර බලකා මූලස්ථානය
7. විල්පත්තුව බලකා මූලස්ථානය
8. වව්නියාව බලකා මූලස්ථානය
9. කිලිනොච්චි බලකා මූලස්ථානය
10. විශ්වමඩු බලකා මූලස්ථානය
11. මුලතිව් බලකා මූලස්ථානය
12. වැලිඔය බලකා මූලස්ථානය
13. කැබිතිගොල්ලෑව බලකා මූලස්ථානය
14. හොරොව්පොතාන බලකා මූලස්ථානය
15. ගෝමරන්කඩවල බලකා මූලස්ථානය
16. ත්‍රිකුණාමලය බලකා මූලස්ථානය
17. සේරුවිල බලකා මූලස්ථානය
18. පොළොන්නරුව බලකා මූලස්ථානය
19. මැදිරිගිරිය බලකා මූලස්ථානය
20. මහඔය බලකා මූලස්ථානය
21. උහන බලකා මූලස්ථානය
22. අම්පාර බලකා මූලස්ථානය
23. මොණරාගල බලකා මූලස්ථානය
24. කතරගම බලකා මූලස්ථානය
25. සේරුපිට බලකා මූලස්ථානය
26. පහලළන්ද බලකා මූලස්ථානය

පුහුණු පාසල් - 02

1. කල්පිටිය පුහුණු පාසල
2. ගල්කිරියාගම උසස් පුහුණු පාසල

දෙපාර්තමේන්තු මූලස්ථානය මඟින් බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්වලට අදාළ පාලන කටයුතු සිදු කරන අතර දෙපාර්තමේන්තු මූලස්ථානයෙහි අංශ 26ක් යටතේ එම පාලන කාර්යන් විමධ්‍යගත කර ඇත.

i. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය
ii. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
iii. අභ්‍යන්තර විගණන අංශය
iv. ආයතන අංශය
v. ගිණුම් අංශය
vi. වැටුප් අංශය
vii. මෙහෙයුම් අංශය
viii. පිරිස් පාලන අංශය
ix. ප්‍රසම්පාදන අංශය
x. ප්‍රවාහන අංශය
xi. පුහුණු අංශය
xii. ව්‍යාපෘති අංශය
xiii. සුබසාධක අංශය
xiv. ඉදිකිරීම් හා නඩත්තු අංශය
xv. තාක්ෂණ අංශය
xvi. මාධ්‍ය අංශය
xvii. ක්‍රීඩා අංශය
xviii. පෞද්ගලික ලිපි ගොනු අංශය
xix. විදුලි වැට සම්බන්ධීකරණ ඒකකය
xx. සේවා වනිතා ඒකකය
xxi. යහසාධක අරමුදල
xxii. සුවසවිය අරමුදල
xxiii. විශ්‍රාම වැටුප් අංශය
xxiv. විනයාරක්ෂක අංශය
xxv. නීති අංශය
xxvi. ක්‍රමසම්පාදන අංශය

එක් එක් බලකා මූලස්ථාන, පුහුණු පාසල් සහ දෙපාර්තමේන්තු මූලස්ථානයෙහි අංශයන්ට අදාළව 2025 වර්ෂය සඳහා සැලසුම්ගත කාර්යන්හි කාර්යසාධනය වෙන් වෙන්ව දක්වා ඇත.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

- සුවසවිය අරමුදල
- යහසාධක අරමුදල
- සුබසාධන අරමුදල
- ක්‍රීඩා අරමුදල
- ආගමික අරමුදල
- සේවා වනිතා අරමුදල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ) ව්‍යාපෘතියේ නම -

ආ) දායක නියෝජිතායතනය -

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු. මි -

ඈ) ව්‍යාපෘති කාල සීමාව -

නැත


2.1 දෙපාර්තමේන්තු ප්‍රගතිය

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යුධ විජයග්‍රහණයෙන් පසු නැගෙනහිර නවෝදය, උතුරු වසන්තය, සෞභාග්‍යයේ පෙර දැක්ම වැනි රජයේ ජාතික සංවර්ධන සංග්‍රාමයන්ට දායක විය. ඒ අනුව, රටේ ආහාර ඉල්ලුමට සරිලන වී, ධාන්‍ය, එළවලු වැනි මහා පරිමාණ කෘෂි, පශු ව්‍යාපෘතීන් ද, ගඩොල්, බ්ලොක් ගල් වැනි ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය ව්‍යාපෘතීන් ද ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතීන් මේ වන විට වාර්ෂිකව ඉතා විශාල මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලබන දීර්ඝ කාලීන ආයෝජන ලෙස ක්‍රියාත්මක වන අතරම, රටේ ජාතික සංවර්ධනයට ද අඛණ්ඩ දායකත්වයක් දරනු ලබයි. තවද අලි මිනිස් ගැටුම් අවම කිරීම උදෙසා වනජීවී දෙපාර්තමේන්තුව හා සම්බන්ධතාවයෙන් කටයුතු කරනු ලබන අතර එහිදී දිවයින පුරා ස්ථාපිත විදුලි වැටවල් 397 ක (කිමී 4699.82) නඩත්තු හා අධීක්ෂණ කටයුතු සිදු කරයි.

ඊට අමතරව මෙම දෙපාර්තමේන්තු සාමාජිකයින් රාජ්‍ය ආයතන වල ආරක්ෂක රාජකාරි, නර්තන හා සංගීත කණ්ඩායම් සේවා, ඉදිකිරීම්, නඩත්තු හා විවිධ සේවා සැපයීම තුළින් ද ආදායම් උත්පාදනය කිරීමට සමත් වී ඇත.

රජයේ ආහාර සුරක්ෂිතතා වැඩපිළිවෙල සාක්ෂාත් කර ගැනීම සඳහා 2025 වර්ෂයේ වී වගාවෙන් අස්වැන්න කිලෝ 10,361,856 ප්‍රමාණයක් නිෂ්පාදනය කර ඇති අතර රු 834,937,625.00 ක අදායමක් රජයට ලබා දී ඇත. ඒ අනුව, සමස්ථ දෙපාර්තමේන්තුවේ ආදායම් ලෙස, 2025 වර්ෂය තුළ පමණක් රුපියල් 1,334,703,722.63ක් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැර කර ඇත.

ව්‍යාපෘති කාණ්ඩය	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024	2025
	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි
ව්‍යාපෘති	295	631	541	375	382	482.5	379.2	655.3	907.8	1,363.18	579.13
ආරක්ෂක සේවා	25	204	312	491	606	375.7	320.5	741.7	528.9	638.30	693.33
නර්තන හා සංගීත	-	27	11	6	17	3	1.6	4.6	4.6	1,60	9.56
නඩත්තු සේවා	-	23	19	22	24	17.5	25.58	67.3	28.5	79.87	38.16
ඉදිකිරීම් සේවා	-	30	58	87	102	90.5	1.57	6.4	8.6	27.09	7.40
ආරක්ෂක සේවා	3	141	202	16	25	9	41.06	89.7	67.1	63.77	4.82
එකතුව	323	1,056	1,143	997	1,156	978.2	769.5	1565	1545.5	2,173.81	1,334.70




2.2 එක් එක් බලකා මූලස්ථාන , පුහුණු කඳවුරු මඟින් 2025 වර්ෂය තුළ රජයේ ආදායමට බැර කරන ලද ව්‍යාපෘති හා සංස්කෘතික ආදායම් සටහන

2025 වර්ෂයට අදාළව ඉහත 2.1. වගුව මඟින් කෘෂි, පශු, ගඩොල් යන කාණ්ඩ යටතේ පොදුවේ දක්වා ඇති ආදායම ඒ ඒ බලකා මූලස්ථාන, පුහුණු කඳවුරු යටතේ වෙන් වෙන් වශයෙන් ඒ ඒ ආයතනයන්හි ප්‍රගතිය ලෙස පහත දක්වා ඇත. තවද, පහත දක්වා ඇති ආදායම් හා ව්‍යාපෘති ඒ ඒ බලකා මූලස්ථාන, පුහුණු කඳවුරු යටතේ වැඩිදුරටත් සවිස්තරාත්මකව දක්වා ඇත.

බලකා මූලස්ථාන / පුහුණු පාසල් / උප බලකා / ව්‍යාපෘති	2025 වර්ෂයේ රජයේ ආදායමට බැර කරන ලද මුදල (රු.)
අම්පාර	17,532,950.32
අනුරාධපුර	3,972,626.50
ගෝමරන්කඩවල	8,498,616.50
හොරොව්පතාන	43,401,707,00
කැබතිගොල්ලෑව	59,412,631.90
මහනුවර	44,080,00
ත්‍රිකුණාමලය	19,013,685.46
කතරගම	242,430.00
කටුනායක	6,829.00
කිළිනොච්චිය	40,656,177.00
කුරගල	-
මැදිරිගිරිය	4,201,676.00
මහඔය	20,491,971.25
මොණරාගල	97,445,662.52
මුලතිව්	32,066,224.50
පොළොන්නරුව	18,900,234.60

බලකා මූලස්ථාන / පුහුණු පාසල් / උප බලකා / ව්‍යාපෘති	2025 වර්ෂයේ රජයේ ආදායමට බැර කරන ලද මුදල (රු.)
පුත්තලම	9,211,215.00
සේරුවිල	7,887,025.25
උහන	33,728,291.50
විල්පත්තුව	41,458,240.55
වවුනියාව	12,422,054.25
වැලිඔය	63,374,202.00
වෙන්නවත්ත	
කොණ්ඩච්චි	10,000,000.00
ගල්කිරියාගම	349,660.00
විශ්වමඩු	14,165,523.00
මිහින්තලය	-
කල්පිටිය	2,237,958.00
මූලස්ථානය/සේරුපිට	1,188,096.20
පහළලන්ද	17,211,949.70
වැලිසර	-
එකතුව	**579,121,718.00**



2.3 පරිපූරක හමුදාවක් ලෙස ක්‍රියා කිරීම සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මානව සම්පත් කළමනාකරණය

යුධ විජයග්‍රහණයෙන් අනතුරුව රට තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවට සහ පොලිස් සේවාවට සහාය වීම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයක් වේ. ඒ අනුව 2025 වර්ෂය තුළ දිවයින පුරා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මානව සම්පත් විවිධ කාර්යන් සඳහා පහත පරිදි යොදවා ඇත.මෙම කාර්යයන් ඉදිරි වර්ෂයන්හී ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ඊට අමතරව පහත පරිදි දෙපාර්තමේන්තුවේ මානව සම්පත විවිධ කාර්යයන්හි යොදවා ඇත. තවද විවිධ අපදා අවස්ථා සඳහා සහාය වීම හා මැතිවරණ රාජකාරි සඳහා සහාය වීම වැනි කාර්යයන් සිදු කෙරෙනු ඇත.
ඊට අමතරව පහත පරිදි දෙපරේතමේන්තුවේ මානව සම්පත විවිධ කාර්යයන්හි යොදවා ඇත.

කාර්යය	භට සංඛ්‍යාව
පුරාවිද්‍යාත්මක ස්ථාන සඳහා	305
රාජ්‍ය ආයතන සඳහා ආරක්ෂාව සැපයීම	1811
විදුලි වැට නඩත්තු හා කාර්යාල කටයුතු සඳහා	3119
වන අලි කළමනාකරණය හා වන අලි පලවා හැරීම	776
පොලිස් ස්ථාන සඳහා	3031
ඉදිකිරීම් රාජකාරි	162
ආගමික ස්ථාන සඳහා	2554

ගඩොල් ව්‍යාපෘති



බ්ලොක්ගල් ව්‍යාපෘති



අත්කම් ව්‍යාපෘති



පේෂකර්ම ව්‍යාපෘති



2.4 ජාතික උත්සව සහ වෙනත් වැදගත් අවස්ථා සඳහා දායකත්වය

ජාතික නිදහස් සැමරුම් උළෙල සඳහා තූර්යවාදක කණ්ඩායම් සාමාජිකයින් 71 ක්ද සම්මාන පෙළපාලිය වෙනුවෙන් 51 ක් සමන්විත කණ්ඩායමක්ද, නන්දිමිත්‍ර කණ්ඩායම වෙනුවෙන් සාමාජිකයින් 51 දෙනෙකු ඇතුළු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සාමාජික/සාමාජිකාවන් 220 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සහභාගී කරවන ලදී.





2.5 යලි පිබිදෙන කුරගල පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාව හා පුදබිම ඉදිකිරීම් ව්‍යාපෘතිය

2013.04.26 වන දින එවකට ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් කුරගල සංචාරයේදී අන්‍යාගමික ග්‍රහණයට නතුවී තිබූ කුරගල පුරාවිද්‍යා ස්මාරක සහිත පූජණීය ස්ථානය මුල්කොට ගෙන එම ගමෙහි පදිංචි තරුණ පිරිස් 54 දෙනෙකු බඳවාගෙන කුරගල පුජා භූමි සංරක්ෂණ කටයුතු සඳහා යොදවා ඇත. පසුව එම කටයුතු අවසන් වූ පසු මෙම ස්ථානය වෙන්නවත්ත බලකා මූලස්ථානයට අනුබද්ධ ව්‍යාපෘති කාර්යාලයක් බවට පත්කර ඉන් අනතුරුව කතරගම බලකායට අනුයුක්තව පවත්වාගෙන යන අතර මේ වන විට 200 කින් යුත් හට පිරිසක් සමග කුරගල ව්‍යාපෘති කාර්යාලය නමින්, රාජ්‍ය ආයතන ආරක්ෂක රාජකාරි, ආදීයෙහි හටපිරිස් යොදවා පවත්වාගෙන යනු ලබයි. 2024 වර්ෂයේදී කුරගල ව්‍යාපෘතිය බලකා මූලස්ථානයක් බවට පත් කරන ලදී.





2.6 ඉදිකිරීම් කටයුතු සඳහා දායකත්වය

ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා පෙදරේරු, වඩු, විදුලි කාර්මික, ජලනල කාර්මික වැනි ක්ෂේත්‍රයන්ගේ ලත් පුහුණුව සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සේවය රාජ්‍ය අංශයේ විවිධ ආයතන වෙත හා ආගමික සිද්ධස්ථාන වෙත ලබා දෙනු ලබයි.

2.7 විදුලි වැට ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සහ වනඅලින් පලවා හැරීම

අලිමිනිස් ගැටුම් බහුලව පවතින ප්‍රදේශවල මිනිසුන්ගේ හා අලි ඇතුන්ගේ ජීවිත බේරා ගැනීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වන අලි කළමනාකරණ ,පලවා හැරීම්, හා අලිවැට ඉදිකිරීම් හා නඩත්තු ව්‍යාපෘතින් රාශියක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ සිවිල් ආරක්ෂක භටයන් 3925 ක් යොදවා කිලෝ මීටර් (4699.82) ක දිගින් යුක්ත වන විදුලි වැටවල් 397 ක් නඩත්තු කර පවත්වාගෙන යනු ලබයි.





2.8 ගුරු හිඟය පවතින දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල් වෙත ස්වේච්ඡා ගුරුවරුන් අනුයුක්ත කිරීම

දිවයිනේ ඉතා දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටි ගුරුවරුන් හිඟ පාසල්වල දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කරනු වස්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් සුදුසුකම් ලත් ගුරුවරුන් 183 ක් උතුරු, උතුරු මැද හා නැගෙනහිර පළාත් වල පාසල් 138 ක් වෙත අනුයුක්ත කර ඇත.

2.9 දෙපාර්තමේන්තුව යටතේ පවතින බලකා මූලස්ථාන වෙතින් ක්‍රියාවට නංවා ඇති කෘෂි ව්‍යාපෘති

වී වගාව





බඩ ඉරිගු





පේර වගාව





පොල් වගාව





2.10 ඩෙංගු මර්ධන වැඩසටහන් පැවැත්වීම

2025 වර්ෂයේ දිවයිනේ විවිධ ප්‍රදේශ තුළ ඩෙංගු මදුරුවන් බෝවීම හා පැතිරීම හේතුවෙන් පොදු ස්ථාන හා ඩෙංගු බෝවීමේ ස්ථාන හඳුනාගෙන ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ උපදේශකත්වයෙන් විශේෂ ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, රට පුරා විවිධ ප්‍රදේශයන්හි පිහිටි ආයතන විසින් පවත්වන ලද ඩෙංගු මර්ධන වැඩසටහන් 123 ක් සඳහා සාමාජික/සාමාජිකාවන් 1229 ක් යොදවා ඇත.





ක්ලීන් ශ්‍රී ලංකා වැඩ සටහන යටතේ පිරිසිදු කිරීම





2.11 මත් උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

රට තුළ තරුණ තරුණියන් හා ළමා පරපුර මත්ද්‍රව්‍ය භාවිතයට විශාල වශයෙන් ඇබ්බැහි වීම හේතුවෙන් එය අවම කර ගැනීම හා මතින් තොර රටක් යන අරමුණින් මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව විශේෂ සුහුණුව ලත් උපදේශකයින් යොදවා උපදේශන වැඩසටහන් 30ක් පමණ ක්‍රියාත්මක කර ඇත.





ජීවිතාරක්ෂක කටයුතු සඳහා සහාය වීම





ආගමික කටයුතු සඳහා සහාය වීම





2.12 දෙපාර්තමේන්තුමය සුභසාධන ක්‍රියාකාරකම්

සිවිල් ආරක්ෂක සාමාජික සාමාජිකාවන්ගේ පවුල්වල පාසල් දරුවන් සඳහා අභ්‍යාස පොත් බෙදා දීම සහ නිවාස බෙදා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී







2.13 නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි

විහාර මහා දේවී උද්‍යානය, කාක දූපත වෙරළ උද්‍යානය, කොළඹ පාවෙන වෙළඳ සංකීරණය, මාදිවෙල ඇවිදින මංතිරුව ආදී ස්ථාන රාශියක නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි සඳහා හටයන් 250 දෙනෙකු වර්ෂය පුරා රාජකාරියෙහි අනුයුක්ත කර ඇත.

2.14 බලකා මගින් ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘති

- රෝහල් අළුත්වැඩියාව වෙනුවෙන් ශ්‍රමදායකත්වය ලබා දීම
- වෙහෙර විහාරස්ථාන ඉදිකිරීමට අවශ්‍ය ශ්‍රමදායකත්වය සපයාදීම
- මැටි භාණ්ඩ ව්‍යාපෘති/ගඩොල් නිෂ්පාදන ව්‍යාපෘති /පශු සම්පත් ව්‍යාපෘති/ඉදල් නිෂ්පාදන ව්‍යාපෘති ආදිය සිදු කිරීම
- කරණවැමි ව්‍යාපෘති පවත්වාගෙන යාම
- දීසවාපි චෛත්‍ය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

දිවිවා සුළි කුණාටුවෙන් ආපදාවට ලක්ව අවතැන් වූ ජනතාව වෙනුවෙන් සහන සැලසීම





වෙහෙර විහාරස්ථාන ඉදිකිරීමට සහාය වීම





කරණවැමී ව්‍යාපෘතිය



3. 2025දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

2025.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය රු.

අයවැය වර්තමාන වර්ෂය (2024)		සටහන	තත්‍ය රු. වර්තමාන වර්ෂය 2025	ඉකුත් වර්ෂය නැවත ගළපන 2024	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ - 1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	-	
-	**මුළු ආදයම් ලැබීම් (අ)**		-	-	
-	**ආදයම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		22,528,487,742	20,711,350,075	ඒසීඒ - 3
-	තැන්පතු		1,177,109,765	1,098,481,407	ඒසීඒ - 4
-	අත්තිකාරම් ගිණුම්		375,512,333	369,905,585	ඒසීඒ - 5/5(අ)
-	වෙනත් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**24,081,109,840**	**22,179,737,067**	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**24,081,109,840**	**22,179,737,067**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		1,333,082,215	2,091,274,443	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**22,748,027,624**	**20,088,462,625**	
	අඩු කළා: වියදම		-	-	
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ -2(II)
22,768,000,000	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	22,764,700,352	20,646,364,222	
725,200,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	599,382,149	564,170,086	
95,700,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	88,430,761	40,755,174	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
23,588,900,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**23,452,513,261**	**21,251,289,482**	

	මූලධන වියදම්				
47,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	25,428,593	43,194,336	
7,626,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	5,615,811	11,798,552	
-	ප්‍රාග්ධන පැවරීම්	12	-	-	**ඒසිඒ - 2(II)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
6,000,000	හැකියා වර්ධනය	14	4,814,635	1,245,555	
96,474,000	වෙනත් මූලධන වියදම්	15	32,003,562	59,170,944	
157,100,000	**මුළු මූලධන වියදම් (උ)**		**67,862,602**	**115,409,387**	
	තැන්පතු ගෙවීම්		1,189,699,785	1,134,488,769	**ඒසිඒ 4**
	අත්තිකාරම් ගෙවීම්		327,272,771	292,454,785	**ඒසිඒ 5**
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**1,516,972,556**	**1,426,943,553**	
23,746,000,000	**මුළු වියදම එ = (ඊ+උ+ඌ)**		**25,037,348,419**	**22,793,642,422**	
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)		**(2,289,320,795)**	**(2,705,179,797)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**(2,289,320,795)**	**(2,705,300,539)** **120,742**	**ඒසිඒ-7** **ඒසිඒ-3**

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ -පි

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

			තත්‍ය
	සටහන	වර්තමාන වර්ෂය 2025	ඉකුත් වර්ෂය 2024
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ -6	**3,608,388,481**	**2,421,429,326**
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ -5/5(අ)	**497,056,498**	**545,296,059**
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ -3	-	-
මුළු වත්කම්		**4,105,444,979**	**2,966,725,385**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		**460,669,696**	**496,198,495**
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		**3,608,388,481**	**2,421,429,326**
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ -5(ආ)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ -4	**36,386,802**	**48,976,822**
අග්‍රිම ශේෂය	ඒසීඒ -3	-	**120,742**
මුළු වගකීම්		**4,105,444,979**	**2,966,725,385**

පිටු අංක 01 සිට 34 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු ඇමුණුමේ පිටු අංක 35 සිට 69 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තරද මෙම අවසන් ගිණුමේ අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා,ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරණ විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණය ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	~~ගණන්දීමේ නිලධාරි~~	~~ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)~~
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 2026.02.27	දිනය 2026/02/26	දිනය : 2026.02.26
ඩී.ඩබ්.ආර්.බී. සෙනෙවිරත්න ලේකම් මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය 18 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.	මේජර් ජෙනරල් කේවීපීපී ප්‍රනාන්දු ආර්ඩබ්පී ආර්වස්පී වීවස්වී යුවස්පී එන්ඩියු අධ්‍යක්ෂ ජනරාල් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	වී. ඩී. ප්‍රසංගිකා සහකාර අධ්‍යක්ෂ (විදෙස්ගත ගිණුම්) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ජය මාවත, කටුබැද්ද, මොරටුව.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය **2025**	ඉකුත් වර්ෂය නැවත ගලපන ලද **2024**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	2,605,035,509	3,060,564,181
අග්‍රිම ලැබීම්	22,528,367,000	20,711,350,075
අත්තිකාරම් අයකර ගැනීම්	373,485,125	370,381,996
තැන්පතු ලැබීම්	1,177,109,765	1,098,481,407
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**26,683,997,399**	**25,240,777,659**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	23,262,969,971	21,100,376,471
සහනාධාර සහ මාරුකිරීම්	88,430,761	40,755,174
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	414,800,036	465,897,889
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,333,082,215	2,091,274,443
අත්තිකාරම් ගෙවීම්	327,272,771	292,454,785
තැන්පතු ගෙවීම්	1,189,699,785	1,134,488,769
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**26,616,255,539**	**25,125,247,531**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**67,741,860**	**115,530,129**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-

අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	67,862,602	115,409,387
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**67,862,602**	**115,409,387**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(67,862,602)**	**(115,409,387)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(120,742)	120,742
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**(120,742)**	**120,742**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**120,742**	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.4.1 පිළියෙල කිරීමේ අරමුණ

1 මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුව පිළියෙල කර ඇත.

<u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2 2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4 ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5 දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6 දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7 මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

8 දෙපාර්තමේන්තු පොත් තුළ හඳුනා නොගන්නා ලද මූල්‍ය නොවන වත්කම් (ජීව විද්‍යාත්මක වත්කම්) හෙළිදරව් කිරීම

ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවීම හේතුවෙන් 2025 මූල්‍ය ප්‍රකාශය තුල මූල්‍ය නොවන වත්කම් යටතේ හඳුනා නොගන්නා ලද ජීව විද්‍යාත්මක වත්කම් ඇමුණුම x යටතේ හෙලිදරව් කර ඇත.

9 දෙපාර්තමේන්තු පොත් තුල ගිණුම්ගත නොකරන ලද මූල්‍ය නොවන වත්කම් (වෙනත් යන්ත්‍ර හා උපකරණ) හෙළිදරව් කිරීම

දෙපාර්තමේන්තුව විසින් ස්ථානීය වශයෙන් හඳුනාගෙන තක්සේරු කලද, 2025 මූල්‍ය ප්‍රකාශය තුල මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත නොකරන ලද වෙනත් යන්ත්‍ර හා උපකරණ ඇමුණුම xi යටතේ හෙලිදරව් කර ඇත.

10 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වෙනත් ශීර්ෂ වෙතුවෙන් රැස් කරන ලද ආදායම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ අංක 06/2024 ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව, වෙනත් දෙපාර්තමේන්තු වෙතුවෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද

ආදායම 2025.12.31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශය(ACA-F) තුල සහ ACA - 1 ආකෘතිය තුල වාර්තා කර නොමැත. එම තොරතුරු ඇමුණුම xiv මගින් හෙලිදරව් කර ඇත.

11 2025.12.31 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ 03 ප්‍රකාරව 2025.12.31 දිනට පිළියෙළ කරන ලද හිඟ ආදායම් පිළිබඳ වාර්තාව ඇමුණුම xiii යටතේ අන්තර්ගතය

.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තා කිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

12 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව(වාර්තා කරන ආයතනය)විසින් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව (වාර්තා කරන ආයතනය) විසින් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම් සම්බන්ධ තොරතුරු ඒ ඒ වැය ශීර්ෂය යටතේ ඇමුණුම xiv මගින් හෙලිදරව් කර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු.)	අවසන් ඇස්තමේන්තුව (රු.)	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.02.99	පොළිය	24,000,000	24,000,000	20,197,913	84
20.03.99.00	විකුණුම් හා ගාස්තු	1,890,000,000	1,890,000,000	1,335,453,774	71
20.04.01.00	සමාජ ආරක්ෂණ දායක මුදල්			1,247,377,760	0
20.02.01.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී	-	-	582,000	
20.06.02.01	ප්‍රාග්ධන වත්කම් විකිණීම (වාහන)	600,000	600,000		-
20.06.02.02	ප්‍රාග්ධන වත්කම් විකිණීම (වෙනත්)	200,000	200,000	1,424,062	712

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.)	අවසාන ප්‍රතිපාදනය (රු.)		
පුනරාවර්තන	22,273,000,000	23,588,900,000	23,452,513,261	99
ප්‍රාග්ධන	157,000,000	157,100,000	67,862,602	43

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන (රු.)		
01	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	වැටුප් හා දීමනා ගෙවීම		93,159,295	93,159,295	100%
02	ශ්‍රී ලංකා ගුම්රිය දෙපාර්තමේන්තුව	නිදහස් ගුම්රිය බලපත්‍ර වියදම්		7,953,235	7,953,235	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		2,262,893,933	-	-
9152	යන්ත්‍රෝපකරණ		914,732,849		-
9153	ඉඩම්		366,834,000		-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		-
9155	ජීව විද්‍යාත්මක වත්කම්		60,711,700		-
9160	කෙරීගෙන යන වැඩ		3,216,000	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඩීඊඑෆ්/ඊ/සිඑස්ඩී/2025/එෆ්ඒ

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2026 මැයි 21 දින

අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
2.ලේකම් - මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඩී්ඒග්/ඊ්/සිඑස්ඩී/2025/එග්ඒ | ඔබේ අංකය உமது இல. Your No. } | දිනය திகதி Date } 2026 මැයි 21 දින

අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ **1.6** ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට **(ශ්‍රී.ලං.වි.ප්‍ර)** අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025** දෙසැම්බර් **17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025** දෙසැම්බර් **17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක **19** දරන ජාතික විගණන පනතේ **16(1)** වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ **38(1)(ඇ)** උප වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ

සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

කෘෂි, සත්ව හා වෙනත්, සංගීත හා නර්තන, ආරක්ෂක සේවා, ඉදිකිරීම් හා නඩත්තු සේවා යන අංශ මගින් දෙපාර්තමේන්තුව වාර්ෂිකව ආදායම් රැස්කරන අතර, එම ආදායම් ප්‍රභවයන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 1,335,453,774 ක ආදායමක් ඉපයූ බව මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කර තිබුණි. වාර්ෂිකව උපයනු ලබන මෙම ආදායම් ගිණුම් ගත කිරීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා වෙනම ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) උපලේඛන තුල ඇතුලත්ව තිබූ වාහන 13 ක් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ACA 6 ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබූ අතර, ඒ අනුව එම ප්‍රමාණයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල, පිරියත හා උපකරණ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) උපලේඛන අනුව වාහන සඳහා වර්තමාන අයිතිය වෙනත් ආයතනයක් සතුව පවතින අවස්ථා 23 ක්, අයිකරණය සතුව අයිතිය පවතින අවස්ථා 14 ක්, පුද්ගලික නාමයන්ට අයිතිය පවතින අවස්ථා 07 ක් හා වර්තමාන අයිතිය සොයාගත නොහැකි අවස්ථා 02 ක් නිරීක්ෂණය වූ අතර, 2025 දෙසැම්බර් 31 දින වන විටත් එම වාහන වල අයිතිය පවරා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තවද රු.16,240,000 ක් වටිනා පවරා නොගත් වාහන 24 ක් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ACA 6 වාර්තාවේ ඇතුලත් වී තිබුණි.

(ඇ) තක්සේරු කර තිබූ වටිනාකම රු.61,808,500 ක් වූ බිම් කැබලි 16 ක අයිතිය පවරා ගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ ACA 6 ප්‍රකාශය තුල ඇතුලත් කර නොතිබුණු අතර, ඒ මඟින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල, පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව සතු රු.519,559,100 ක් වටිනා වත්කම් ගිණුම්ගත නොකිරීම මත අවසන් ගිණුම්හි වත්කම් ලේඛනය තුල ඇතුලත් නොවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල වත්කම් වටිනාකම රු.591,559,100 කින් අඩුවෙන් ගිණුම් ගත වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයිතිය පවරාගෙන තිබූ බිම් කැබලි 14 ක් සඳහා වූ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර නොතිබුණි.

1.6.3 මූල්‍ය වත්කම්

(අ) 2024 වර්ෂයේ අවසාන අත්තිකාරම් ණය ශේෂ 25 ක වටිනාකම් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස දැක්වීමේදී එම වටිනාකම් රු.2,001,202 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් ආරම්භක අත්තිකාරම් ණය ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2024 වර්ෂයේ අවසාන ශේෂ ලෙස දක්වා නොතිබූ අත්තිකාරම් ණය ශේෂ 26 ක් 2025 වර්ෂයේ ආරම්භක ඍණ ශේෂ ලෙස දක්වා තිබූ අතර ඒ අනුව රු.449,324 කින් ආරම්භක අත්තිකාරම් ණය ශේෂ අඩුවෙන් දක්වා තිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	ණය හා අත්තිකාරම් ලේඛනය	2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 05 ඡේදය	දෙපාර්තමේන්තුව විසින් එක් එක් නිලධාරීන් වෙනුවෙන් ආරම්භක ශේෂ සහ ඒ ඒ මාසයේ අවකරණය කර ගන්නා ණය මුදල් ප්‍රමාණයන් හා පොලිය සහ දෙසැම්බර් 31 දිනට ණය මුදලේ තවදුරටත් අයවීමට ඇති ශේෂය දක්වමින් පවත්වාගත යුතු CC – 10 ණය හා අත්තිකාරම් ලේඛනය පවත්වා නොතිබුණු අතර, පරිගණක පැතුරුම්පතක් ආධාරයෙන් ණය ශේෂ හා අයකිරීම් සටහන්කර තිබුණි.
(ආ)	හානි පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 110	හානි පිළිබඳ ලේඛනය අදාල වටිනාකම් ඇතුලත්ව විස්තරාත්මකව පවත්වාගත යුතු වුවත් පාලන අංශය විසින්

		පවත්වා ගෙන යනු ලබන හානි පාඩු ලේඛනයෙහි හානියට අදාළ විස්තර සටහන් කිරීමේදී අවධිමත් ලෙස සටහන් තැබීම්, නිසි අධිකාර බලයක් රහිතව සටහන් සංශෝධන සිදුකිරීම් හා ලේඛනයට ඇතුළත් නොවූ හානි පාඩු පැවතීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.
(ඇ) නිවාඩු ලේඛනය	ආයතන සංග්‍රහය XII වන පරිච්ඡේදය, පොදු 190 අංකනිය.	දිස්ත්‍රික් නිලධාරී, නියාමක හා සිවිල් ආරක්ෂක හට වැටුප් අංක 12653 සිට 22305 දක්වා නිවාඩු ලේඛන පමණක් විගණනයට ලබා දී තිබූ අතර විගණනයට ලබා දුන් නිවාඩු ලේඛනයන්හි ඉකුත් වර්ෂ වල නිවාඩු ශාරාංශය යාවත්කාලීන කර නොතිබූ අතර නියාමක හා සිවිල් ආරක්ෂක හට වැටුප් අංක 12653 සිට 22305 දක්වා නිවාඩු සටහන් කරන ලද ලේඛනයේ දක්වා තිබූ කිසිදු නිවාඩුවක් අනුමත කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ)	ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.	1.6.1
1.6.3 (ඇ)	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුවීම.	1.6.2 (ඇ)
1.6.3 (ඉ)	තක්සේරු කර නිවැරදි වටිනාකම් ගිණුම් ගත කළ යුතුවීම.	1.6.2 (ඉ)
1.6.3 (අ)	සියළු වාහන වටිනාකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම.	1.6.2 (අ)
1.6.5 (ආ)	2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සී.සී.10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතුය.	1.6.4 (අ)
3.1	හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වීම.	3.1 (අ)
3.2 (අ)	පිළියෙල කරන ලද ඇස්තමේන්තු අනුව වියදම් හැකිතාක් කළමනාකරණය කර ගත යුතු වීම.	3.2
4.3 (ඇ)	ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම.	4.2(අ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) ආරක්ෂණ සේවා වෙනුවෙන් 2017,2018,2021 හා 2022 යන වර්ෂ වලට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ ආදායම රු.10,896,378 ක් වන අතර, ඉන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 වර්ෂයට අදාළව ලක් පොහොර සමාගමෙන් අය විය යුතු රු.862,431 ක මුදල අයකර ගත නොහැකිව වසර 2 ක කාලයක් ඉක්ම ගියද එම මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව වෙත 2025 යල කන්නයේ වී අස්වැන්න අළෙවියෙන් රු.157,924,680 ක මුදලක් ලැබිය යුතු නමුත් මේ දක්වාම එම මුදල අය කරගෙන නොතිබුණි.

(ඇ) සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවට වී අස්වනු අලෙවි කිරීම සම්බන්ධයෙන් 2025 අප්‍රේල් 10 වන දින ඇතිකර ගත් ගිවිසුමෙහි කොන්දේසි අංක 3.7 ප්‍රකාරව "මිලදී ගනු ලබන සියළුම වී තොගයන් වෙනුවෙන් ගෙවිය යුතු මුදල් මිලදී ගත් දින සිට මාසයක් ඇතුලත දෙපාර්තමේන්තු ආදායම් රැස්කිරීමේ ගිණුම වෙත පියවීමට ක්‍රියා කිරීම " යන්න සඳහන් කොට ඇති නමුත් 2025 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂයන්ගේ මාසයකට වැඩි අගයන්ගේ එකතුව රු. 368,461,745 ක් විය.

3.2 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව සහේතුකව පූර්වානුමාන කළ හැකි සියළුම සේවාවන් ඇස්තමේන්තුවල ඇතුලත් කර ඇති බවටත් ඒවා මුදල් වර්ෂය තුල තම දෙපාර්තමේන්තුවට ඉටුකල හැකි ශක්තිය ඇති බවටත් හා ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවටත් ගණන්දීමේ නිලධාරියා වගබලාගත යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු වෙනස් කිරීමේ විවලනතාවය සියයට 100-137 ක් අතර පරාසයක පැවතුණි.

3.3 වියදම් අතිරික්තය

වෙනත් වැය ශීර්ෂ 02 කට අදාළව දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබූ රු.10,039,993 ක ප්‍රතිපාදන භාවිතා නොකර ඉතිරිව පැවතුණි.

3.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

මූල්‍ය ප්‍රකාශන තුල හෙළදරවු කර තිබූ රු.38,819,224 ක් වටිනා බැදීම් හා බැරකම් 2026 වර්ෂයේ මාර්තු අවසන් වන විටද පියවා නොතිබුණි.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) 1951 අංක 14 දරන මෝටර් රථ වාහන පනතේ 25 වන වගන්තිය.	2025 වර්ෂයට අදාලව වාහන 74ක් සඳහා ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.
(ආ) 2015 පෙබරවාරි 09 දිනැති අංක IAD/GA15/8/අමා.සංදේශ/ 2 දරන අමාත්‍ය	(i) ආගමික සිද්ධස්ථාන ආදියෙහි සුළු හා මධ්‍ය පරිමාණ ඉදිකිරීම් කටයුතු සඳහා දෙපාර්තමේන්තු ග්‍රම බලකාය යොදා ගැනීමට නිර්දේශ කර තිබූ අතර, ඒ අනුව අනුමැතිය ලබාදී තිබුණි. එම අමාත්‍ය මණ්ඩල

මණ්ඩල සංදේශයේ 03 ඡේදයේ (01) අනුව එම සංදේශයට 2015 මාර්තු 05 දිනැති අංක අමප/15/0089/610/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණය

තීරණයට පටහැනිව මෙම දෙපාර්තමේන්තුව විසින් ආගමික ස්ථාන ආරක්ෂක රාජකාරි කටයුතු සඳහා භටයින් 307 ක්, ආගමික ස්ථාන සුභ සාධක හා නඩත්තු කටයුතු සඳහා 1,344 ක්, ආගමික ස්ථාන රියදුරු රාජකාරි සඳහා භටයින් 139 ක් ඇතුලුව එකතුව 1,790 ක භට/භටවරියන් ප්‍රමාණයක් ආගමික ස්ථානවල විවිධ රාජකාරි කටයුතු සඳහා යොදවා තිබුණි. මෙම පිරිස සඳහා 2025 වර්ෂයේදී වැටුප් ලෙස රු.1,074,000,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2.2 යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ආදායම් ඉපදවීමේ ආයතනයක් බවට පරිවර්ථනය කර ගැනීම සඳහන් වුවද, 2025 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු සඳහා අනුයුක්ත කරන ලද භට/භටවරියන් 831 කට අදාළව සපයන ලද සේවාව වෙනුවෙන් රජයට අයවිය යුතු මුදල අදාල ආගමික ස්ථානවලින් අයකරගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. මෙම පිරිස සඳහා 2025 වර්ෂයේදී වැටුප් ලෙස රු.498,600,000 ක මුදලක් ගෙවා තිබුණි.

(iii) කිසිදු නීතිමය ප්‍රතිපාදනයක් නොමැතිව දෙපාර්තමේන්තුවේ සේවය කරන භට/ භටවරියන් 4,456 ක් 2025/2026 මහ කන්නයේදී ද 3515 ක් යල කන්නයේදී ද අඳ වී ගොවිතැන් කටයුතු සඳහා මාස 04 බැගින් සඳහා මුදාහැර තිබුණි. මෙම කාලපරිච්ඡේදවලට අදාලව එම භට/ භටවරියන්ට වැටුප් ලෙස පිළිවෙලින් රු.891,200,000 ක් හා රු.703,000,000 ක් ගෙවා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 103 හා 104

(i) 2023 සහ 2024 වර්ෂවලදී ආරම්භ කර අවසන්ව තිබූ ව්‍යාපෘති 17 ක අපේක්ෂිත අස්වැන්න කිලෝ ග්‍රෑම් 195,525 හා සත්‍ය අස්වැන්න කිලෝ ග්‍රෑම් 88,385 ක් වූ අතර ඒ අනුව අහිමිව තිබූ අස්වනු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 107,140 ක් හා අහිමිවීමේ ප්‍රතිශතය සියයට 55 ක් විය. තවද,

	ව්‍යාපෘති 2 කින් අපේක්ෂිත ආදායම රු.7,076,664 ක් හා සත්‍ය ආදායම රු. 5,613,100 ක් වූ අතර ඒ අනුව ළඟා කර නොගත් ආදායම රු.1,463,564 ක් විය. ඒ අනුව මෙම අපේක්ෂිත අස්වනු හා අපේක්ෂිත ආදායම් ළඟා කර නොගැනීම පිළිබඳව දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති අංශය විසින් පරීක්ෂණ පවත්වා හානි සිදු වී ඇත් ද යන්නත්, හානි සිදු වී ඇත්නම් ඒ සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි පරීක්ෂාවන් කිරීමටත් කටයුතු කර නොතිබුණි.
	(ii) 2024/2025 වසර වල හට පිරිස් 348 ක් යොදවා ආරම්භ කර මෙතෙක් අවසන් කර ඇති ව්‍යාපෘති 17 ක අපේක්ෂිත ආදායම රු.32,191,000 ක් හා සත්‍ය ආදායම රු.12,910,495 ක් විය. අපේක්ෂිත ආදායම ලඟා කර ගැනීමට අපොහොසත් වීමෙන් රජයට අහිමි වූ ආදායම රු. 19,280,505 ක් විය. ඒ අනුව මෙම අපේක්ෂිත අස්වනු හා අපේක්ෂිත ආදායම් ළඟා කර නොගැනීම පිළිබඳව දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති අංශය විසින් පරීක්ෂණ පවත්වා හානි සිදු වී ඇත් ද යන්නත්, හානි සිදු වී ඇත්නම් ඒ සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂාවන් කිරීමටත් කටයුතු කර නොතිබුණි.
(ඇ) 2017 අප්‍රේල් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 03/2017, 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 සහ 2009 ජූනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009(I)	(i) සියලුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කිරීම කළ යුතු වුවද 2025 ජූනි මාසයේ බලකා මූලස්ථානයේ සේවය කළ වැටුප් ගෙවා තිබූ නිලධාරීන් 449 දෙනෙකු අතරින් නිලධාරීන් තිදෙනෙකු හැර ඉතිරි සියළු නිලධාරීන් ඇඟිලි සලකුණු විධිමත් පරිදි තබා නොතිබුණි. ඒ අතරින් 2025 ජූනි මාසය තුලදී ඇඟිලි සලකුණු කිසිම දිනක සටහන් නොකරන ලද නිලධාරීන් 46 දෙනෙකු සඳහා ගෙවා තිබූ වැටුප රු.3,071,364 ක් විය. ඇඟිලි සලකුණු සටහන් කර තිබූ ඉතිරි සියළු දෙනාගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම අක්‍රමවත් වූ අතර නියමිත වේලාවට පසු පැමිණීම, නියමිත වේලාවට පෙර පිටවයාම, පැමිණීම් හෝ පිටවීම් පමණක් සටහන් කර තිබීම, පැමිණීම් සටහන් නොවූ දිනවලට නිවාඩු දමා

නොතිබීම, කෙටි නිවාඩු අනුමත කර නොගෙන නියමිත වේලාවට කලින් පිටව යාම යනාදිය නිරීක්ෂණය විය. වැටුප් ගෙවීමේදී නිලධාරීන්ගේ ඇඟිලි සලකුණු මඟින් පැමිණීම හා පිටවීම තහවුරුකර නොගන්නා බව නිරීක්ෂණය විය. ඇඟිලි සලකුණු සටහන් කිරීම අක්‍රමවත් වීම හේතුවෙන් බොහෝ නිලධාරීන් වර්ෂයේ නියමිත නිවාඩු ඉක්මවා වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේ සම්භාවිතාවක් පැවති නමුත් ඇඟිලි සලකුණු සටහන් සමඟ සසඳමින් නිවාඩු ලේඛන යාවත්කාලීන කර නොතිබුණි.

(ii) සියලුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීම මඟින් නිලධරයන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතු වුවත් නිලධාරීන් 3,828 ක් සිටි සේරුවාවිල,ත්‍රිකුණාමලය හා ගෝමරන්කඩවල යන බලකා වල නිලධරයන්ගේ පැමිණීම සහ පිටවීම සනාථ කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍ර නොතිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6 ඡේදය

සංචිත වාහන සඳහා අනුයුක්ත කර ඇති සියළුම රියදුරන් පොදු 268 හා 268(අ) ආකෘතිය පරිද රියදුරු අත්පොතක් ද නිල වාහන සඳහා අනුයුක්ත කර ඇති සියළුම රියදුරන් 2008 ජූලි 26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008 හි ඇමුණුම එක ලෙස දක්වා ඇති ආකෘතිය පවත්වාගෙන යා යුතු වුවද, ප්‍රවාහන අංශය විසින් ලබාදුන් තොරතුරු අනුව ධාවනය කෙරෙන වාහන 54 ක මයිලෝමීටරය අක්‍රියව තිබීම හේතුවෙන් රියදුරන් රාජකාරි ඉටු කිරීමට අපහසු වී තිබුණි.

3.6 අවිධිමත් ගනුදෙනු

(අ) සේරුපිට බලකාය විසින් රු.3,150,000 ක් වටිනා මෝටර් රථයක් නිසි අනුමැතියකින් තොරව පුද්ගලික ගරාජයකට භාරදී මාස 17 කට අධික කාලයක් නිශ්කාර්යව පැවතීම මත දිරාපත් වීමට, කොටස්වලට ගැලවීමට හා රථයට හානි වීමට ඉඩ ප්‍රස්ථා සැලසීමටත් එම තත්ත්වය පිළිබඳ බලකා අණදෙන නිලධාරී හා ප්‍රවාහන අංශයේ ඉහළ නිලධාරීන් සොය බැලීමට කටයුතු නොකිරීමෙන් රජයට අලාභයක් වී තිබූ අතර 2025 වර්ෂයේදී ධාවනයට නුසුදුසු අපහරණය කිරීමට යෝජිත රථයක් ලෙස කොටස්

වෙන් කර සේරුපිට බලකාය වෙත රැගෙන විත් වගකිව යුතු නිලධාරියකුගේ ලිඛිත භාර ගැනීමකින් තොරව බලකා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතු බලකා, පුහුණු පාසල් හා කාර්යාල මඟින් භාවිතයෙන් ඉවත් කරන ලද රථ වාහන 93 ක් අපහරණය කිරීම සඳහා සේරුපිට බලකා මූලස්ථානය තුල ගාල් කර තිබූ අතර ඉන් වාහන 39 ක් එම බලකාය වෙත ලැබුණු දිනයන් ලිපි ගොනුවේ සඳහන් වී නොතිබුණි. මෙම ඉතිරි වාහන 54 බලකාය වෙත ලැබී ඇත්තේ 2019 ත් 2025 ත් යන වර්ෂයන්ට අදාල කාල පරාසයන් තුලදී වේ. මෙම රථ දීර්ඝ කාලයක් එක තැන ගාල්කර තිබීම හේතුවෙන් විශාල ලෙස හානි හා විනාශ වීම සිදු වී තිබූ අතර මේ දක්වාම අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුව විසින්, මිය ගිය නිලධාරියෙකුට හා විශ්‍රාම ගිය නිලධාරීන් 07 කට වැඩිපුර ගෙවා තිබූ වැටුප් රු.336,604 ක් හා එම කාලය තුලදී සේවය හැර ගිය නිලධාරීන් 40 කට වැඩිපුර ගෙවා තිබූ රු.398,228 ක් වූ වැටුප් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.7 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) කිලිනොච්චිය බලකායට අයත් ගිණුම් අංක 7041093 ඉදිරිපත් නොකල චෙක්පත් වටිනාකම ලෙස රු.672,371 සටහන් වුවද, ඊට අදාළ උපලේඛනයේ කිසිදු තොරතුරක් නොවීය.

(ආ) ගිණුම් අංක 7042755 දරන දෙපාර්තමේන්තු බැංකු ගිණුමට අදාළව හඳුනා නොගත් ගෙවීම් අවස්ථා 12 ක්දී එකතු වටිනාකම රු.924,710 ක් 2026 ජනවාරි 30 වන විටත් හඳුනාගෙන නොතිබූ බව විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) ගිණුම් අංක 7042755 දරන දෙපාර්තමේන්තු බැංකු ගිණුමට අදාළව හඳුනා නොගත් ලැබීම් අවස්ථා 169 ක එකතු වටිනාකම රු.39,709,060 ක් වටිනා ලැබීම් මාස 01 ත් 11 ත් අතර කාලයක් ගතවන තුරුද, හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ප්‍රසම්පාදනයන්

(අ) 2024 වර්ෂයේ භාණ්ඩ, වැඩ හා උපදේශනාත්මක නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.5 අනුව ලංසු කරුවන් විසින් බැඳියාවන් පිළිබඳ සවිටනයක් නොමැති බව, එක් ලංසුවක් පමණක් ඉදිරිපත් කරන බව සහ දුස්සන්ධානීය ක්‍රියාවන්ට

සම්බන්ධ නොමැති බවට අනිවාර්ය ප්‍රකාශයක්, දිවුරුම් ප්‍රකාශයක් ලෙස ලංසුව සමඟ ලබා දිය යුතු වුවත් රු.2,256,227 ක් වැය කර වාහන සඳහා ටයර් සහ බැටරි මිලදීගෙන තිබූ ප්‍රසම්පාදනයන් 16 ක දී එම දිවුරුම් ප්‍රකාශය ලබා ගැනීමට ප්‍රසම්පාදන අස්ථිත්වය කටයුතු කර නොතිබුණි. තවද, එම මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.5.4 ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර බැඳියාවන් පිළිබඳ සවිටනයක් නොමැති බවට ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන්ගේ, ලංසු ඇගයුම් කමිටු සාමාජිකයන්ගේ, ප්‍රසම්පාදන කමිටුවලට සහය වන මාණ්ඩලික නිලධාරීන්ගේ සහ අනෙකුත් නිලධාරීන්ගේ ප්‍රකාශ අදාළ ප්‍රසම්පාදන ගොනුවලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5 අනුව යම් ප්‍රසම්පාදනයකට අදාලව භාණ්ඩ භාර ගැනීම "භාණ්ඩ භාර ගැනීමේ කමිටුව" මඟින් සිදු කළ යුතු අතර එම කමිටුව පත් කිරීමේ වගකීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.2 හා 2.6 අනුව ගණන් දීමේ නිලධාරියාට පැවරෙන නමුත් ප්‍රසම්පාදනයන්ගේ ලද භාණ්ඩ, භාණ්ඩ භාර ගැනීමේ කමිටුවක් හරහා සිදු කර නොතිබුණි.

(ඇ) 2025 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 1.2(ඇ)(i) පරිදි ආර්ථිකමය බව, කාර්යක්ෂමතාව, ඵලදායිතාව, සමානාත්මතාව සහ මුදලට සරිලන වටිනාකම ඉහල නැංවීම ප්‍රසම්පාදනයේ අරමුණක් වුවත් රු.3,054,648 ක් වැයකර ට්‍රැක් බොටම් සහ කළු ටී ෂර්ට් සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය මිලදී ගැනීමේදී 2024 ජනවාරි සැලසුම් කළ ප්‍රසම්පාදනය 2025 මාර්තු දක්වා ප්‍රමාද වීමෙන් ප්‍රසම්පාදනයේ අරමුණක් වන කාර්යක්ෂමතාවය ඉටුනොවී ඇති බව හා 1.2(ඇ)(iv) 2025 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි වැඩ ක්‍රියාත්මක කිරීම, භාණ්ඩ බෙදාහැරීම, සේවා සැපයීම සහ තොරතුරු පද්ධතිය සම්පූර්ණ කිරීම යන කාර්යයන් කඩිනමින් ඉටු කිරීම යන ප්‍රසම්පාදනයේ අරමුණ ඉටු වී නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.1 ප්‍රකාරව තාක්ෂණික ඇහයීම් කමිටුවේ නිර්දේශ/නිරීක්ෂණවලට ප්‍රසම්පාදන කමිටුව එකඟ වන්නේනම් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිළිබඳ තීරණයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ලබාදිය යුතු අතර, 2024 නොවැම්බර් 20 දින එසේ ලබාදුන් නිර්දේශ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ සභාපති එම තීරණයට එකඟවේද, නොවේද යන්න දක්වා නොතිබුණි.

(ඈ) වටිනාකම රු.2,124,112 ක් වූ කොළකැමා නිල ඇඳුම් මැසීම සඳහා අවශ්‍ය නිල ඇඳුම් ආයිත්තම් මිලදී ගැනීමේදී 2024 ජනවාරි 01 දිනෙන් ආරම්භකර 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමට සැලසුම් කර තිබූ ප්‍රසම්පාදනය 2025 ඔක්තෝබර් 21 දක්වා කල් ගත වීමෙන් ප්‍රසම්පාදනයේ අරමුණක් වන කාර්යක්ෂමතාවය ඉටුවී නොතිබුණි. තවද, දින 15 ක කාල ප්‍රමාදයකින් තාක්ෂණික ඇහයීම් කමිටුව පත්කිරීම මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.4(අ)(iii) පරිදි නියමිත කාලය තුල කොන්ත්‍රාත් ප්‍රධානය කිරීම සහතික කිරීම සඳහා ප්‍රසම්පාදන කාල සටහන සමාලෝචනය කිරීම හා එකඟ වීම, 2.4(අ)(iii) පරිදි ප්‍රසම්පාදන

ක්‍රමය, ලංසු කැඳවීමේ ක්‍රියා පටිපාටිය සහ භාවිතා කල යුතු කොන්ත්‍රාත් වර්ගය, ලංසු/යෝජනා ඉදිරිපත් කිරීමේ සහ එහි ලංසු/යෝජනා විවෘත කිරීමේ කාලසීමාව පිළිබඳ නිරීක්ෂණය කිරීම හා **2.4(අ)(iv)** ප්‍රසම්පාදන අස්ථිත්වයට ප්‍රශස්ත තාක්ෂණික සහ මූල්‍ය වාසි අත්කර ගැනීමට භාණ්ඩ,වැඩ සහ උපදේශන නොවන සේවා ප්‍රසම්පාදනය කිරීම සඳහා, ප්‍රසම්පාදනයේ තරඟකාරීත්ව සහ ප්‍රමාණාත්මක බව ප්‍රවර්ධනය කිරීම සඳහා එකී ලේඛනවල අන්තර්ගතයේ පරිපූරණත්වය සහතික කිරීම පිණිස, කෙටුම්පත් ප්‍රසම්පාදන ලේඛනවල පරිපූර්ණත්වය සහතික කිරීම පිණිස, කෙටුම්පත් ප්‍රසම්පාදන ලේඛන සමාලෝචනය කිරීම, නිර්දේශ කිරීම සහ අනුමත කිරීම යන කාර්යයන් ඉටු වී නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද **ACA 6** ප්‍රකාශයේ ඇතුලත් කර තිබූ රු.**980,409,946** ක් වටිනා වාහන **950** ක් සම්බන්ධයෙන් සිදුකල විගණන පරීක්ෂාවේදී රු. **3,490,250** ක් වටිනා පාපැදි **277** ක් ද ඇතුලත්ව මුල් වාහන සංඛ්‍යාව **673** ක් වුවද අධ්‍යක්ෂ පාලනගේ **2026** ජනවාරි **23** දිනැති අංක සිආදෙ/**18/23/02 (73)** දරන ප්‍රවාහන අංශය විසින් ලබාදුන් වාහන ලැයිස්තුව තුල ඇතුලත්ව තිබුණේ පාපැදි හැර වාහන **562** ක් පමණි.

(ආ) මූල්‍ය ප්‍රකාශ තුල ඇතුලත් කර තිබූ රු.**249,834,460** ක් වටිනා වාහන **173** ක් ප්‍රවාහන අංශයෙන් ලබාදී තිබූ උපලේඛන තුල ඇතුලත් කර නොතිබුණු අතර, එම වාහන සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) සේරුවාවිල බලකායේ භාවිතයට ගත හැකි භාණ්ඩ අයිතම **33** කට අයත් ඒකක **350** ක් ගබඩා තුළ භාවිතයට නොගෙන වර්ෂ **04** ත් වර්ෂ **11** ත් අතර කාලයක් ගබඩා තුළ නිශ්කාර්යව පැවතුණි. එම භාණ්ඩ අයිතම අතර සවිකිරීමට සුදුසු ට්‍රැක්ටරයක් නොමැති වීම හේතුවෙන් රොටවේටරයක් ද, බ්ලොක් ගල් මැෂින් **1** ක් ද, කොම්පොස්ට් නිශ්පාදන යන්ත්‍ර **1** ක් ද පැවතුණි.

(ඈ) වටිනාකම රු.**315,069,000** ක් වූ බිම් කැබලි **16** ක් ගිණුම් අංශය විසින් ගිණුම්ගත කර තිබූ නමුත් පාලන අංශය විසින් ලබා දුන් තොරතුරුවල එම බිම් කැබලි ප්‍රමාණය ඇතුලත් වී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට බිම් කැබලි **467** ක නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබීම මත වටිනාකම් ගිණුම්වලට ඇතුළත් කිරීමට නොහැකි වී තිබුණි.

(ඊ) 2021 අගෝස්තු 09 හා 2023 නොවැම්බර් 24 දින අතර කාලය තුල හොරොව්පතාන,වවුනියාව,කිලිනොච්චිය,අම්පාර,උහන හා කතරගම බලකා වල ගබඩාව වෙත ලැබුණු රු.391,284 ක වටිනාකමකින් යුතු පොස්පේට් පොහොර කිලෝ ග්‍රෑම් 28,499 ක් හා යූරියා පොහොර කිලෝ ග්‍රෑම් 150 ක් 2025 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි.

(උ) පොළොන්නරුව බලකායේ ගබඩාව තුල දියර පොහොර ලීටර් 404 ක් 2024 ඔක්තෝබර් 01 දින කල් ඉකුත් වී 2025 දෙසැම්බර් 31 දින වන විට වසරකට අධික කාලයක් ගතවී තිබුණි.

(ඌ) විවිධ බලකා පරිශ්‍රයන්හි ගාල්කර ඇති රථවාහන 23 ක් මාස 12 ක් හෝ ඊට වැඩි කාල පරාසයක සිට උපයෝජනයකින් තොරව නිශ්කාර්යව පැවතුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 හා 891 ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු විධායක තනතුරු 03 කට හා ද්විතීක තනතුරු 02 කට අදාළ නිලධාරීන් 75 දෙනෙකුට අදාළ ඇප මුදල් තබා නොතිබුණි.

4.4 පාඩු හා හානි

(අ) මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක්ද, මුදල් රෙගුලාසි 104 (4) අනුව අලාභහානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුලත දී පූර්ණ වාර්තාවක්ද ඉදිරිපත් කල යුතු වුවත් දෙපාර්තමේන්තුවේ හානි හා පාඩු ලේඛනය පිළිබඳ පරීක්ෂාවේදී හානි පාඩු සිද්ධීන් 39 කට අදාල මණ්ඩල වාර්තා හා නිර්දේශයන් ප්‍රමාද වී තිබුණි.

(ආ) මොණරාගල බලකායේ නිලධාරීන් විසින් සිදු කරන ලද මූල්‍ය අක්‍රමිකතා හා අවභාවිතයන් සම්බන්ධව කිසිදු ඝටහනක් හානි පාඩු ලේඛනයේ හෝ මූල්‍ය ප්‍රකාශන ඝටහන්වල ඇතුලත්ව නැති අතර එම අක්‍රමිකතාවය සිදුකල නිලධාරීන් ගෙන් රු.25,852,200 ක මුදලක් අයකර ගත යුතුව පැවතියද ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) වටිනාකම රු.3,150,000 ක් වූ අංක LD- 9669 දරන ලොරි රථය 2022 නොවැම්බර් 17 දින ගරාජයට භාරදී මාස 17 කට පසු එම රථය අපහරණය කිරීමට යෝජිත රථයක් ලෙස නම්කර කොටස් ලෙස වෙන් කර සේරුපිට බලකාය වෙත රැගෙන විත් වගකිව යුතු නිලධාරියෙකු භාර ගැනීමකින් තොරව බලකා පරිශ්‍රයේ ගාල් කර තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් රජයට සිදුවූ පාඩුව පිලිබඳ කිසිදු ඝටහනක් හානි හා පාඩු ලේඛනයේ සහ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් වී නොතිබුණි.

(ඇ) 2022 වර්ෂයේ හොරොවිපතාන බලකායේ උඳු හා මිරිස් බීජ කල් ඉකුත් වීමෙන් සිදු වූ අලාභය රු.649,920 ක් වූ අතර එය මුදලින් සියයට 50 ක් හා දෙපාර්තමේන්තු ගාස්තු ලෙස මුළු වටිනාකම රු.406,200 ක් අය කිරීමට තීරණය කර ඇති නමුත් 2025 දෙසැම්බර් 31 දින වන විටත් ඒම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2016 වර්ෂයේදී කතරගම බලකා මූලස්ථානයේ අභ්‍යන්තර මාර්ග පද්ධතියේ අක්‍රමිකතාවය හේතුවෙන් රු.434,348 ක අලාභය අයවිය යුතු නමුත් දෙපාර්තමේන්තුව 2025 දෙසැම්බර් 31 දින වන විටත් ඒම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මූලස්ථානයට අයත් අංක HE -5631 දරන ජීප් රථය 2022 සැප්තැම්බර් 17 දින හුන්නස්ගිරිය ප්‍රදේශයේදී ගියර් බොක්ස් පද්ධතියේ ඔයිල් පිටතට කාන්දුවීම හේතුවෙන් රු.475,000 ක පාඩුවක් දෙපාර්තමේන්තුවට සිදු වී ඇති අතර, ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට පත් කර ඇති මණ්ඩලයේ අඩුපාඩු නිරීක්ෂණය වී ඇති අතර නැවත මණ්ඩල පත්කර වගකිය යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2022 හා 2023 වර්ෂවලදී අම්පාර කරංකෝව වී වගා ව්‍යාපෘතිය විනාශ වීම හේතුවෙන් සිදු වූ අලාභය රු.765,155 ක මුදල මණ්ඩල වාර්තා අනුව අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට දැනුම් දී තිබුණද මෙතෙක් අය කර ගෙන නොතිබුණි.

(ඌ) කිලිනොච්චිය බලකායේ 2024/2025 මහකන්නයේ අක්කර 5 ක වී වගාව විනාශ වීම සහ මූලස්ථානයේ අංක LC – 5667 දරන කැබ් රථය අනතුරට පත්වීම සම්බන්ධයෙන් වූ අලාභයන් 2025 දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කර ලේඛන ගත කර නොතිබුණි.

(එ) මහඔය ගඩොල් ව්‍යාපෘතියේ අක්‍රමිකතාවය යටතේ ආරම්භක කපා නොහල ශේෂය රු.2,962,165 ක් වන අතර රු.2,009,506 ක වටිනාකමක් අයකර ගැනීම් ලෙස සටහන් කර තිබුණද කපා නොහල ඉදිරියට ගෙන ගිය ශේෂය තුලින් අදාළ අයකර ගැනීම් අඩුකර නොතිබුණි.

(ඒ) අනුරාධපුර ඇඟළුම් ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීමේදී සිදු වී ඇති අක්‍රමිකතාවට අදාළ රු.560,700 ක මුදල වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගෙන ඇති නමුත් ඒ පිළිබඳව හානි පාඩු ලේඛනයේ සටහනක් නොමැති අතර මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඔ) 2023 වර්ෂයේදී පොලොන්නරුව බලකාය මඟින් පවත්වා ගෙන ගිය ජාතික පශු සම්පත් මණ්ඩලය (NLDB) කෘෂි ව්‍යාපෘති අක්‍රමිකතාවයේ මූල්‍ය අලාභය 2025 සිව්වන කාර්තු විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව අනුව රු.377,582 ක් වූ නමුත් 2025 මූල්‍ය ප්‍රකාශන තුල රු.128,519 ක් ලෙසත් හානි පිළිබඳ ලේඛනයේ රු.377,583 ක් ලෙසත් සටහන්ව තිබුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) 2006 සැප්තැම්බර් 13 දිනැති අංක 1462/20 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් සහ 2015 මාර්තු 05 දිනැති අංක අමප/15/0089/610/003 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් රජය විසින් පවරා ඇති අමතර කාර්යයන්වලට පටහැනිව දෙපාර්තමේන්තුවට පවරා ඇති රාජකාරී තුල නොමැති වූ පාසල් ගුරු රාජකාරී ලෙස ත්‍රිකුණාමලය බලකායේ භටයෙක් හා ගෝමරණ්කඩවල බලකායේ භටයෙකු පාසල් ගුරු රාජකාරී සඳහා යොදවා තිබූ බව අනාවරණය විය.

(ආ) 2018 වර්ෂයේදී රු.862,030 ක් වැය කර ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ නව දේශන ශාලා ගොඩනැඟිල්ලේ වහලය මට්ටමට පමණක් ගොඩ නඟා තිබූ අතර 2019 වර්ෂයෙන් පසු කිසිදු ඉදිකිරීමක් සිදු කර නොතිබීම හේතුවෙන් දරා ඇති මුළු වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඇ) මියගිය නිලධාරීන් 148 දෙනෙකුගෙන් අයවිය යුතු රු.3,614,705 ක ණය ශේෂ පැවති අතර ඒ තුල නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 3 ත් 5 ත් අතර පැරණි රු.433,139 ක ණය ශේෂ සහ නිලධාරීන් 75 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 1 ත් 3 ත් අතර පැරණි රු.2,186,746 ක ණය ශේෂ ඇතුලත් වී තිබුණි.

(ඈ) විශ්‍රාම ගිය නිලධාරීන් 151 දෙනෙකුගෙන් අයවිය යුතු රු.3,119,115 ක් වටිනා ණය ශේෂ පැවති අතර, එම ණය ශේෂ තුල නිලධාරීන් 41 දෙනෙකුගෙන් අය විය යුතු රු.697,053 ක් වටිනා වසර 1 ත් 3 ත් අතර පැරණි ණය ශේෂ සහ නිලධාරීන් 13 දෙනෙකුගෙන් අය විය යුතු රු.198,142 ක් වටිනා වසර 3 ත් 5 ත් අතර පැරණි ණය ශේෂ විය.

(ඉ) වැඩ තහනම් කරන ලද නිලධාරීන් 61 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,049,501 ක් වටිනා ණය ශේෂ පැවති අතර, එම ණය ශේෂ තුල නිලධාරීන් 31 දෙනෙකුගෙන් අයවිය යුතු රු.684,801 ක් වටිනා වසර 1 ත් 3 ත් අතර පැරණි ණය ශේෂ සහ නිලධාරීන් 8 දෙනෙකුගෙන් අය විය යුතු රු.563,174 ක් වටිනා වසර 3 ත් 5 ත් අතර පැරණි ණය ශේෂ විය.

(ඊ) සේවය අතහැර ගොස් තිබූ නිලධාරීන් 539 දෙනෙකුගෙන් අයවිය යුතු රු.24,849,550 ක් වටිනා ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයකර ගැනීමට පැවති අතර, එම ණය ශේෂ තුල නිලධාරීන් 17 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,492,457ක් වටිනා වසර 5 ත් 10 ත් අතර පැරණි ණය ශේෂ සහ නිලධාරීන් 99 දෙනෙකුගෙන් අය විය යුතු රු.7,256,294 ක් වටිනා වසර 3 ත් 5 ත් අතර පැරණි ණය ශේෂ විය.

(උ) අධ්‍යක්ෂ(පාලන) ගේ අංක සිඅදෙ/ප්‍රවා/විගණන අධිකාරී විමසුම්/2025(65) දරන 2026 ජනවාරි 07 දිනැති විගණනය සඳහා තොරතුරු ලබාදීමේ ලිපිය අනුව පෞද්ගලික ගරාජ තුල ගාල්කර ඇති රු18,359,460 ක් වටිනා රථ 06 අතුරින් රු. 3,519,820 බැගින් වටිනා PG-0423 දරන රථය හා PG 0425 දරන වෑන් රථ දෙක පිළිවෙලින් මාස 18 ක් හා මාස 15 ක කාලයක් ගත වී තිබුණද මේ වන විටත් එම රථ වල අලුත්වැඩියා කටයුතු අවසන් කර නොතිබුණි. තවද රු.34,400,000 ක් වටිනා අධි ධාරිතාවයෙන් යුතු ජීප් රථ 04 ක්, මාස 03 - 12 ත් අතර කාලයක් තුල භාවිතයෙන් ඉවත් කර තිබූ අතර විවිධ වර්ගයේ වාහන 24 ක් අලුත්වැඩියා කටයුතු හේතුවෙන් කාලයක සිට දෙපාර්තමේන්තු රථ ගාලේ ගාල්කර තිබුණි.

(ඌ) දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ගාල්කර ඇති රථ වාහන 24 ක් 2026 ජනවාරි 12 දින ප්‍රවාහන අංශයේ නිලධාරීන් සමඟ භෞතිකව පරීක්ෂා කිරීමේදී රු. 115,585,000 ක් වටිනා රථවාහන 24 ක් ස්වාභාවික ලෙස හා සතුන්ගෙන් විනාශවීමට ඉඩ සැලෙසන ආකාරයෙන් වසරකට ආසන්න කාලයක සිට ගාල් කර ඇති බව නිරීක්ෂණය විය.

(එ) දෙපාර්තමේන්තුවය අයත් ධාවනයට නුසුදුසු ලෙස හඳුනාගත් රථවාහන 178 ක් පවතින අතර එම රථවාහන අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කර නැවත භාවිතයට ගැනීමට හෝ නියමිත කාලවකවානුවලදී අපහරණය කිරීමෙන් රජයට ප්‍රතිලාභ ලබා ගත හැකිව තිබුණු නමුත් දෙපාර්තමේන්තුව විසින් එවැනි පියවරක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) දෙපාර්තමේන්තුවට අයත් ධාවනයට සුදුසු වාහන අතුරින් දුම් සහතිකය ලබානොගත් වාහන 246 ක් විය.

(ඓ) 2025 වර්ෂයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම පිළිබඳ පරීක්ෂාවේදී නිලධාරීන් 113 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය ආරම්භයේ අයවීමට පැවති රු. 12,277,301 ක් වූ ණය ශේෂ වර්ෂය තුලදී අයකර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් එම ආරම්භක ණය ශේෂ එලෙසම වර්ෂය අවසානයේදී ද අත්තිකාරම් ශේෂ තුල ඇතුලත්ව තිබුණි.

4.6 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

වැලිසර විශේෂ ව්‍යාපෘතිය මඟින් පවත්වා ගෙන ගිය පිටත බලකා වෙනින් වාර්තා කරන ලද හට පිරිස් සඳහා ආහාර ලබාදීමේ ක්‍රියාවලිය හා බලකා මඟින් නිෂ්පාදනය කරනු ලබන සහල්/ ධාන්‍ය අලෙවි කිරීමේ ක්‍රියාවලියේදී සිදු වූ විෂමතාව සම්බන්ධව කිසිදු සටහනක් හානි පාඩු ලේඛනයේ හෝ මූල්‍ය ප්‍රකාශනයෙහි ඇමුණුම ii හි ඇතුලත් කර නොතිබූ අතර පරීක්ෂණ වාර්තා අනුව එම මූල්‍ය අක්‍රමිකතාවය සිදුකල නිලධාරීන්ගෙන් රු.24,008,622 ක මුදලක් දෙපාර්තමේන්තුව වෙත අයකරගත යුතු නමුත් ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

කේ.කේ.එස්.ජයසොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4. කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉදිරි ව්‍යාපෘති හා සැලසුම් සකස් කර ක්‍රියාවට නැංවීම.		√	
තිරසර සංවර්ධන ජාතික සභාව විසින් ප්‍රකාශිත ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තු සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම		√	
දෙපාර්තමේන්තු පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම	√		
මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුව)		√	
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු කෘෂි, පශු හා විවිධ නිෂ්පාදන ව්‍යාපෘතීන්හි අපේක්ෂිත නිෂ්පාදන / අස්වනු ඉලක්ක සපුරා ගැනීම හා අපේක්ෂිත ආදායම මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම.		√	
විවිධ ඉදිකිරීම්, සිද්ධස්ථාන හා පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂක නඩත්තු, සංරක්ෂණ, නගර අලංකරණ ආදී වශයෙන් පැවරෙන ව්‍යාපෘතීන් නිසි පරිදි ඉටුකිරීම.		√	

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්කය / දර්ශකය	2025 භෞතික ප්‍රගතිය	2025 වර්ෂයේ ජයග්‍රහණලබා ගැනීමේ ප්‍රතිශතය		
				0%-49%	50%-74%	75%-100%
1	2	3	4	5		
2.C **සීමාන්තික වශයෙන් ආහාර මිල උච්ඡාවචනය වීම වැළැක්වීමට ආහාර සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළඳපළවල් සහ ඒවායේ අතුරු නිෂ්පාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම**	1. විවිධ මහා පරිමාණ කෘෂි, පළතුරු, පශු හා වෙනත් දේශීය ආහාර නිෂ්පාදන ව්‍යාපෘති සිදු කිරීම	i. වාර්ෂිකව වී, එළවළු, බඩඉරිඟු, කජු, දේශීය අඹ, විවිධ ධාන්‍ය, කුළු බඩු වගා කිරීම. කිරි, බිත්තර, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන කිරීම	a.වගාකළ අක්කර ගණන/බෝග වශයෙන් වී/අඳ වී - අක්කර 4533 බඩඉරිඟු - අක්කර 272 කවුපි - අක්කර 5 කුරක්කන් - අක්කර 2 උඳු - අක්කර 29 තල - අක්කර 11 රටකජු - අක්කර 45.5 ස්ථීර බෝග - අක්කර 2105.25 මිරිස් - අක්කර 33.5 වෙනත් බෝග - අක්කර 14.5 වාර්ෂික බෝග - අක්කර 0.75 b.ඵලදාව කිලෝ ගණන/බෝග වශයෙන් වී - කි.ග්‍රෑ 7,238,411 බඩඉරිඟු - කි.ග්‍රෑ 242,458 කජු - කි.ග්‍රෑ 97,771 කවුපි - කි.ග්‍රෑ 1009 කුරක්කන් - කි.ග්‍රෑ 1,078 උඳු - කි.ග්‍රෑ 44,974 තල - කි.ග්‍රෑ 1,920 මූං ඇට - කි.ග්‍රෑ 145 රටකජු (අමු) - කි.ග්‍රෑ 7,478 රටකජු (වියලි) - කි.ග්‍රෑ 31,519 වෙනත් භෝග - කි.ග්‍රෑ 7,445 මිරිස් - කි.ග්‍රෑ 1,316			✓

3.5 **හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාර ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම**	7. මත්ද්‍රව්‍ය ජාවාරම ක්‍රියාත්මක වීම වැළැක්වීම සහ පුනුරුප්තාපන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම	ii. වාර්ෂිකව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් 30 ක් දිවයින පුරා පිහිටා ඇති සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු බලකා විසින් පවත්වා ඇත.			✓
4.1. **2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන පරිදි සියලු ගැහැණු හා පිරිමි ළමයින් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික හා ද්විතීයක අධ්‍යාපනයක් සම්පූර්ණකර සිටින බව තහවුරු කිරීම**	7. දිවයිනේ ගුරුවරුන් හිඟ ඉතා දුෂ්කර ප්‍රදේශයන්හි පාසල් වල ගුරුවරුන් ලෙස දැනුම හා නිපුණතාව ඇති සිවිල් ආරක්ෂක නිලධාරීන් අනුයුක්ත කරවීම.	V. 2025 වන විට ගුරු හිඟතා ඇති දිවයිනේ සියළුම පාසල් වෙත අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟතාව මත නිසි පුහුණුව හා නිපුණැති ගුරුවරුන් අනුයුක්ත කරවීම සහ එමඟින් සෑම දරුවකුටම අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම.	මේ යටතේ පාසල් විශේෂයෙන්ම උතුරු, උතුරුමැද හා නැගෙනහිර පළාත් වල පාසල් 138 ක් සඳහා ස්වේච්ඡා ගුරුවරුන් ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් 181 ක් අනුයුක්ත කර ඇත.		✓	
	8. සිවිල් ආරක්ෂක පෙර පාසල් ජාලය තුළ පෙර පාසල් දරුවන් සඳහා දිවා සුරැකුම් හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම	Vi. 2025 වන විට සිවිල් ආරක්ෂක පෙර පාසල් ජාලය 750 දක්වා තවදුරටත් ව්‍යාප්ත කර තවත් දරුවන් 5000කට පමණ පෙර පාසල් හා මුල් ළමාවිය සංවර්ධන පහසුකම් ලබාදීම.	මේ යටතේ පෙරපාසල් හා මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන 223ක් ක්‍රියාත්මක කර ඇත. ඒ මඟින් දරුවන් 5661.ක් වෙත අධ්‍යාපනය හා රැකවරණය ලබා දී ඇති අතර, ඒ සඳහා ගුරුවරු ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් 1096 ක් අනුයුක්ත කර ඇත.			✓
	9. සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයන්ගේ පාසල් යන වයසේ සෑම දරුවකුටම අවශ්‍ය අභ්‍යාස පොත් කට්ටලයක් බැගින් වාර්ෂිකව ලබාදීම.	Viii. 2025 වන විට සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන්ගේ හා ආශ්‍රිත අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට අවශ්‍ය අභ්‍යාස පොත් ලබාදීම.	සිවිල් ආරක්ෂක බලකා සාමාජිකයන්ගේ පාසල් යන දරුවන් 33366 කට නව වසරට අවශ්‍ය පාසල් පොත් 166,830ක් බෙදා දී ඇත.			✓

<table>
<tr>
<td>6 b.
ජලය හා සනීපාරක්ෂක කටයුතු කළමනාකරණයේදී ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගීත්වය, දිරිගැන්වීම සහ සහාය ලබා දීම</td>
<td>1.
දිවයින පුරා ගොඩ වූ වැව් නැවත සැකසීම සහ අපවිත්‍ර වූ වැව් පිරිසිදු කර පිළිසකර කිරීම සඳහා අදාළ ආයතන සමඟ කටයුතු කිරීම.</td>
<td>i.
ගොඩ වූ හා අපවිත්‍ර වූ වැව් මහජන පරිභෝජනයට සුදුසු වන පරිදි සහ කෘෂිකර්මාන්තයට යොදා ගත හැකි ලෙස පිළිසකර කිරීම.</td>
<td>2025 වර්ෂයේදී වැව් පිළිසකර කර නැත.
එසේ නමුත් වකුගඩු රෝගය බහුලව පැතිර යන ප්‍රදේශයන්හි පහත දක්වා ඇති ආයතන මඟින් ස්ථාපනය කර ඇති ජල පෙරණ යන්ත්‍ර 417 ක් සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයන් 573 දෙනෙකු යොදවා දිවා රාත්‍රී පිරිපහදු ජලය ලබා දීම සිදුකර ඇත.
<table>
<tr><th>ආයතනය</th><th>ශ්‍රී ලංකා නාවික හමුදා ජල පිරිපහදු මධ්‍යස්ථාන</th><th>ශ්‍රද්ධාරූප වාහිනියේ ජල පිරිපහදු මධ්‍යස්ථාන</th><th>වෙනත් ජල පිරිපහදු මධ්‍යස්ථාන</th></tr>
<tr><td>මධ්‍යස්ථාන සංඛ්‍යාව</td><td>313</td><td>84</td><td>20</td></tr>
<tr><td>භට සංඛ්‍යාව</td><td>405</td><td>136</td><td>32</td></tr>
</table>
</td>
<td></td>
<td>✓</td>
<td></td>
</tr>
</table>

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.2.1 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ

- මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යභාරය අනුව, එකී කාර්යන් කිනම් තිරසාර සංවර්ධන ඉලක්කයන් හා සැසඳෙන්නේ ද යන වග හඳුනා ගැනීම.

- එම කාර්යන්, අදාළ තිරසර සංවර්ධන ඉලක්ක හා තවදුරටත් සෘජුව සහසම්බන්ධ කර ඊට තිරසාර සංවර්ධන ඉලක්ක මුලික කර ගත් නව මුහුණුවරක් ලබා දීම.

- හඳුනාගත් තිරසාර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ සියලු අංශ වෙත ලබා දුන් උපදෙස් ප්‍රකාරව සැලසුම් සකස් කිරීම, එම සැලසුම් වාර්ෂිකව සැලසුම් වාර්තාවට ඇතුළත් කිරීම හා එම සැලසුම් ක්‍රියාත්මක කරවීම.

- ඉහත 5.1 ඡේදයෙහි හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු අතුරින් මෙම දෙපාර්තමේන්තුවේ සෘජු රාජකාරී වපසරිය තුළ නීතිය හා සාමය සුරැකීම, දිළිඳු බව පිටුදැකීම වැනි අරමුණු කිහිපයක් 75% ක පමණ ප්‍රතිශතයකින් ඉටු කිරීමට හැකි වීම.

5.2.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

- මෙම දෙපාර්තමේන්තුව විශාල ශ්‍රම බලකයකින් සමන්විත දෙපාර්තමේන්තුවකි. එම ශ්‍රම බලකායට විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සරිලන හා විධිමත් ලෙස පවරාගත හැකි ඉඩම් නොමැතිකම එක් අභියෝගයකි.

- එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරගෙන යාමේදී හදිසි සම්පත් ඌනතාවන් ඇති වීම සහ අනපේක්ෂිත ව්‍යසනවලින් ඇති වන බලපෑම් තවත් එක් අභියෝගයකි.

- තිරසාර සංවර්ධන ජාතික සභාව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක වීම සඳහා දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර ප්‍රකාශනයන්හි සිට සියලුම ආයතනික පරිපාටින්, සංවිධාන ව්‍යුහය යාවත්කාලීන කළ යුතුව ඇති බැවින්, ඒ සඳහා අනුගතවීමට යම් කාලයක් වැය වීම.


- මෙම සංකල්පය මෑතක සිට හඳුන්වාදුන් නව වැඩපිළිවෙලක් බැවින් පුර්ව අත්දැකීම්, දැනුම සහ යටිතල පහසුකම් සපයා ගැනීමට හැකි වන සේ මෙම සංකල්පය සාර්ථකව ක්‍රියාත්මක වන ආයතනික පුර්වදර්ශයන්හි හිඟතාව.


- තිරසාර සංවර්ධන ජාතික වැඩපිළිවෙල තුළ එක් එක් ආයතනය වෙත පැවරෙන ඉලක්ක කවරේද යන්න, එම ඉලක්ක අන්තර් සම්බන්ධීකරණයට හා ඉටු කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ජාතික මට්ටමින් පුළුල් සංවිධානාත්මක වැඩසටහනක් ක්‍රියාත්මක නොවීම මත එක් එක් ආයතන මෙම වැඩසටහන තුළ හුදකලා වීම.

6 මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)*
ජ්‍යෙෂ්ඨ	23	18	5
තෘතීයික	84	67	17
ද්විතීක	126	66	60
ප්‍රාථමික	39,960	31,917	8,043
එකතුව	40,193	32,068	8,125





6.2 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
වව්නියාව ඇඟළුම් කම්හල් පිළිබඳ වැඩමුළුව	72	2025.02.05/ 06	100,000.00	-	දේශීය	පුහුණුව හා හැකියාව වර්ධනය
වැලිඔය ඇඟළුම් කම්හල් පිළිබඳ වැඩමුළුව	95	2025.02.07/ 08	100,000.00	-	එම	එම
විනය කාර්යය පටිපාටිය පිළිබඳ වැඩමුළුව	1	2024.10.22 - 2025.01.28 (දින 10 ක්)	25,000.00	-	එම	එම
පෞද්ගලික ලිපි ගොණුවක් පවත්වා ගෙන යාම පිළිබඳ වැඩමුළුව	51	2025.03.05	90,000.00	-	එම	එම
රජයේ වාහන නඩත්තුව පිළිබඳ වැඩමුළුව	49	2025.03.06	60,000.00	-	එම	එම
නිවාඩු භාර නිලධාරීගේ කාර්යභාර්ය පිළිබඳ වැඩමුළුව	60	2025.03.19	90,000.00	-	එම	එම
විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ වැඩමුළුව	4	2025.03.17/ 18	52,000.00	-	එම	එම
ලිපිකරු පාඨමාලාව පිළිබඳ වැඩමුළුව	61	2025.03.17- 2025.03.21 (දින 05 ක්)	250,000.00	-	එම	එම
දෙමල පාඨමාලාව පිළිබඳ වැඩමුළුව	58	2025.03.27 - 2025.08.	112,500.00	-	එම	එම
යන්ත්‍රෝපකරණ පිළිබඳ වැඩමුළුව	10	2025.03.06	60,000.00	-	එම	එම
ළමා නිංසනය පිළිබඳ වැඩමුළුවේ දේශක ගාස්තු	67	2025.01.08	1,800.00	-	එම	එම
ලිපිකරු පාඨමාලාව පිළිබඳ වැඩමුළුව අදියරය 11	82	2025.05.26 - 2025.05.30 (දින 05 ක්)	350,000.00	-	එම	එම
ලිපිකරු පාඨමාලාව පිළිබඳ වැඩමුළුව (දෙමල භාෂාවෙන්)	30	2025.06.30 - 2025.07.04 (දින 05 ක්)	380,000.00	-	එම	එම
විද්‍යුත් ප්‍රසම්පාදනය පිළිබඳව සහ නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිලිබඳ වැඩමුළුව	59	2025.07.15	106,500.00	-	එම	එම

ගබඩාකරණය ඉන්වෙන්ට්‍රි පාලනය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ වැඩමුළුව	29	2024.07.01 සිට 2024.07.15	-	එම	එම	එම
ආපදා කළමණාකරන වැඩමුළුව	44	2025.01.21, 22,23	-	එම	එම	-
අවි පුහුණු පාඨමාලාව අදියර 1	96	2025.08.04 - 2025.08.09	-	එම	එම	එම
පොලිස් රාජකාරී පාඨමාලාව	71	2025.11.13 - 2025.12.19	-	එම	එම	එම
යතුරුපැදි කාර්මික ශිල්පී පාඨමාලාව	1	2025.01.03	-	එම	එම	එම
පරිසණක දෘඩාංග ශිල්පී පාඨමාලාව	1	2025.07.03	-	එම	එම	එම
දෙවන භාෂා පාඨමාලාව අදියර 1	85	2025.08.13 - 2025.09.02	-	එම	එම	එම
දෙවන භාෂා පාඨමාලාව අදියර 2	117	2025.10.01 - 2025.10.18	-	එම	එම	එම
අවි පුහුණු පාඨමාලාව අදියර 2	162	2025.10.27 - 2025.10.31	-	එම	එම	එම
ආපදා කළමණාකරන වැඩමුළුව	44	2025.01.21, 22,23	-	එම	එම	එම
අවි පුහුණු පාඨමාලාව අදියර 1	96	2025.08.04 - 2025.08.09	-	එම	එම	එම
පොලිස් රාජකාරී පාඨමාලාව	71	2025.11.13 - 2025.12.19	-	එම	එම	එම
යතුරුපැදි කාර්මික ශිල්පී පාඨමාලාව	1	2025.01.03	-	එම	එම	එම
පරිසණක දෘඩාංග ශිල්පී පාඨමාලාව	1	2025.07.03	-	එම	එම	එම
දෙවන භාෂා පාඨමාලාව අදියර 1	85	2025.08.13 - 2025.09.02	-	එම	එම	එම
දෙවන භාෂා පාඨමාලාව අදියර 2	117	2025.10.01 - 2025.10.18	-	එම	එම	එම
අවි පුහුණු පාඨමාලාව අදියර 2	162	2025.10.27 - 2025.10.31	-	එම	එම	එම

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය

මෙම දෙපාර්තමේන්තුවට නව බඳවාගැනීම් සිදු නොකරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලැබී ඇත. ඒ අනුව දැනට මෙම දෙපාර්තමේන්තුව වර්ෂ 10 කට ආසන්න කාලයක් තිස්සේ නිලධාරීන් විශ්‍රාම යෑම, මියයෑම, ඉල්ලා අස්වීම්, සේවයෙන් පහකිරීම් යනාදී වශයෙන් කාර්ය මණ්ඩලයේ සිදු වන අඩු වීම් ප්‍රතිපූර්ණය නොවන ක්ෂය වන දෙපාර්තමේන්තුවක් බවට පත් කර ඇත.

ඒ අනුව තාක්ෂණික, සෞන්දර්ය, ක්‍රීඩා, පරිගණක, කාර්මික වැනි විෂයන් තුළ හටයන් කැපවීමෙන් හා දැඩි පුහුණුවෙන් අත්පත් කරගත් දෙපාර්තමේන්තු කීර්තිනාමය හා ප්‍රමිතිය අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යෑමට බාධාවන් මතු වී ඇත. විශ්‍රාම යාම, මියයෑම වැනි හේතූන් නිසා නිපුණැති නිලධාරීන්ගේ දැනුම අහිමි වීමත්, එම හිඟයට අලුතින් බඳවාගැනීම් සිදු කළ නොහැකි වීමත් ඊට හේතුවයි.

අවම වශයෙන් උක්ත දක්වා ඇති විෂයන් සඳහා සීමාවන්ට යටත්ව හෝ නවක නිලධාරීන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට කර ඇති ඉල්ලීම් සඳහා අනුමැතිය ලැබෙන්නේ නම්, එකී කාර්යසාධන රික්තය සාධනීය ලෙස අවම කර ගත හැකි වනු ඇත.

දෙපාර්තමේන්තුවට අනුමත කාර්ය මණ්ඩලය තුළ, උක්ත කි පුරප්පාඩු සම්පූර්ණ කිරීම ඉතා අත්‍යවශ්‍ය හා කඩිනම් අවධානය යොමුවිය යුතු කාරණාවක් බව වැඩිදුරටත් පෙන්වා දෙමු.

*** ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේ ද යන්න**

පැහැදිලි කරන්න

- මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණ වූයේ යුද සමයේ තර්ජිත ගම්මාන ආරක්ෂා කර ගනිමින් රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීමයි. ඒ අනුව කාලීන අවශ්‍යතාව මත අධ්‍යාපන, වෘත්තීය හෝ වෙනත් සුදුසුකම් ඇගයීමකින් තොරව අදාළ ප්‍රදේශයන්හි පදිංචි පුද්ගලයන් යන පදනමින් පමණක් ඔවුහු සේවයට බඳවා ගෙන ඇත. එසේ හෙයින් ඔවුන් අනෙකුත් සන්නද්ධ හමුදා හා පොලිස් සාමාජිකයන්ට සාපේක්ෂව වෘත්තීය හා තාක්ෂණික දැනුමින් අඩු ධාරිතාවක පිරිසක් විය. එසේ නමුත්, යුද විජයග්‍රහණයෙන් පසු විධිමත් විෂය නිර්දේශයක් හා කාල සටහනක් යටතේ දෙපාර්තමේන්තු පුහුණු පාසල් තුළින් ඔවුන් වෙත මූලික හා නායකත්ව පුහුණු ලබා දෙන ලදී. එමගින් ඔවුන් අනෙකුත් හමුදාවන්ට සමාන ආචාරශීලී, විනයගරුක හා වෘත්තීය හමුදාවක් බවට පරිවර්තනය කර ගැනීමට හැකි විය. තවද හමුදා සංග්‍රාම, සරඹ, තූර්ය වාදන, සෞන්දර්ය, තාක්ෂණ වැනි විෂයන්හි වර්තමාන අවශ්‍යතාවන්ට අනුකූලව ඔවුන්ට ලබාදෙනු ලබන පුහුණුව තුළින් හමුදාවක් ලෙස ඔවුන්ගේ ධාරිතා වර්ධනය අපේක්ෂා කෙරේ.

- දෙපාර්තමේන්තුවට අනුමත උසස් කිරීමේ පරිපාටිය අනුව, සේවයේ ස්ථීර වීමට හා ඉදිරි උසස් වීම් සඳහා සුදුසුකම් ලැබීමට මූලික හා නායකත්ව පුහුණු සපුරා තිබීම අනිවාර්ය වේ.

- බාහිර වෘත්තීය පුහුණු ආයතන වෙතින් විවිධ වෘත්තීය පුහුණු ලබා දීම තුළින් සිවිල් ආරක්ෂක සාමාජිකයන් සේවයෙන් විශ්‍රාම ලැබූ පසු වුව ද තම දැනුම හා ශ්‍රමය භාවිතයෙන් විවිධ කර්මාන්තයන්හි ස්වයං රැකියාවක නියැලීමෙන් අතිරේක අදායමක් ලැබිය හැකි වනු ඇත.

- ඊට අමතරව, විශ්වවිද්‍යාල, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව මණ්ඩලය වැනි විවිධ බාහිර ආයතන වෙතින් හා සුදුසුකම් ඇති දෙපාර්තමේන්තු සම්පත් දායකයන් වෙතින් ඔවුන් වෙත ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සංග්‍රහය, ප්‍රසම්පාදන සංග්‍රහය, රජයේ ආයතනික ගිණුම්කරණය, වැටුප් සැකසීම, විගණනය, කාර්යාලයීය කාර්ය පරිපාටි, දෙවන භාෂා පාඨමාලා යනාදී වශයෙන් විවිධ පුහුණු ලබා දීම තුළින් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.6	වෙනත්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල නොවේ	මෙය භාවිතා කිරීමක් සිදු නොවේ.	-

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම.	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම.	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ.	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ.	-	-
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල නොවේ.	-	-

8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූ.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ.	ගර්හිත වන වාහන අපහරණය කිරීම සඳහා අවැසි ඉදිරි කටයුතු ඉතා වේගවත්ව සිදුකල ද ක්‍රියා පටිපාටියෙහි පවතින දුර්වලතා මත යම් යම් ස්ථාන තුල කාර්ය ප්‍රමාද වනු දැකිය හැක.	අපහරණ ක්‍රියා පටිපාටියෙහි පවතින දුර්වලතා හඳුනාගෙන ඊට පිළියම් යෙදීම තුල මෙම තත්ත්වය මග හරවා ගත හැක.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මූ.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	-	අනුකූල නොවේ	කල්බදු ගෙවනු ලබන වාහන මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැත.

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	නිරවුල් කරමින් පවති	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	වර්ෂය අවසාන විමට පෙර පියවා ඇත	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ	-	-
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-

17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ.	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.	-	-

කාර්යසාධන වාර්තාව - 2025		
අනුමැතිය		
මේජර් ජෙනරල් කේඑච්පීපී ප්‍රනාන්දු	අධ්‍යක්ෂ ජනරාල්	
සංස්කරණ හා ප්‍රතිශෝධන කමිටු සාමාජිකයින්		
කර්නල් එස්බීආර් රාජපක්ෂ	අධ්‍යක්ෂ (ව්‍යාපෘති)	සභාපති
ලුතිනන් කර්නල් එම්ඒසිපී මාරසිංහ	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)	සාමාජික
වින්ග් කමාන්ඩර් ඊඑම් කොතලාවල	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පිරිස් පාලන)	සාමාජික
ලුතිනන් කමාන්ඩර් එම්කේඒබී මායාසිංහ	නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ)	සාමාජික
වී.ඩී ප්‍රසංගිකා මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති හා ගිණුම්)	සාමාජික
අධීක්ෂණය හා මෙහෙයවීම		
මේජර් ජනරාල් කේආර්කේකේටී බණ්ඩාර	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	
කර්නල් ආර්ඒජේකේ රණසිංහ	අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)	
කෙටුම්පත්කරණය, සැකසුම හා පරිගණක යතුරු ලියනය		
ආර්කේකේ රත්නදේවී	කාන්තා උප නියාමක	

අවසානය.